# අරුණ

2023 ජූලි 7 සිකුරාදා | හතර වැනි කාණ්ඩය | 239 කලාපය | මිල රු 60.00 | www.aruna.lk



පුවත්පත
නිවසටම ගෙන්වා ගැනීමට
දැන්ම අමතන්න : 0761 367 623
නැතිනම් මෙම කේතය ස්කෑන් කර තොරතුරු ලබා දෙන්න


## පැය 48කදී විදුලිය බිඳවැටීම් 14,000ක්

05 පිටුවට

## රාජකාරි පැහැර හැරි දොස්තරලා නිසා
# රිජ්වේ 8 වාට්ටුවට ඇතුළත් කිරීම් සීමා කෙරේ



■ වරුණි පෙරමුණ

දින දාසයක කාලයක් වෛද්‍යවරියක ඇතුළු වෛද්‍යවරුන් තිදෙනෙකු රාජකාරි පැහැර හැරීම නිසා කොළඹ රිජ්වේ ආර්යා ළමා රෝහලේ අටේ වාට්ටුවේ නේවාසික රෝගී දරුවන්ට ප්‍රතිකාර කිරීමේ කටයුතු අඩාළ වී ඇති බව රෝහල් අධ්‍යක්ෂ වෛද්‍ය ජී. විජේසූරිය අරුණට පැවැසීය. මෙම තත්ත්වය මත එම වාට්ටුවට ළමා රෝගීන් ඇතුළත් කිරීම සීමා කර තිබේ.

02 පිටුවට

# දින 186කදී අලි 227ක් මරලා



## මිනිස්සු 82ක් අලින්ට බිලි වෙලා

■ සාලිය කුමාර ගුණසේකර

මේ වසරේ ජනවාරි මස පළමුවැනිදා සිට ඉකුත් 05 වැනිදා දක්වා වූ දින 186 ක කාලය තුළදී අලි 227 ක් මියගොස් ඇති බව වනජීවි හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය සඳහන් කරයි.

02 පිටුවට

## "තායි රාජා" ගැන තානාපති කියූ කතාව එන්ජීඕ සංවිධානවලට කනේ පහරක්

### හිටපු දියවඩන නිලමේ නෙරංජන් විජයරත්න



■ විමුක්ති නානායක්කාර

තායි රාජා නැවත ගෙනයෑමට අදහසක් නැතැයි කියමින් තායි තානාපතිවරයා මහනුවරදී කර ඇති ප්‍රකාශය තායි - ශ්‍රී ලංකා බෞද්ධ සබඳතාව බිඳදැමීමට උත්සහ කළ එන්ජීඕ සංවිධානවලට දුන් හොඳ කනේ පහරක් යැයි හිටපු දියවඩන නිලමේ නෙරංජන් විජයරත්න පවසයි.

02 පිටුවට

## හීලෑ අලි-ඇතුන් හිඟ වීම පෙරහර සංස්කෘතියට බාධාවක්

### ආණමඩුවේ ධම්මදස්සි අනුනාහිමි



■ කමල් සුරවීර -මහනුවර

පෙරහර නැරඹීමට පැමිණෙන බොහෝ දෙනා වැඩිපුර අලි ඇතුන් දකින්නට කැමැති වුවද හීලෑ අලි ඇතුන්ගේ හිඟය බරපතළ ගැටලුවක්වී ඇති බව අස්ගිරි පාර්ශ්වයේ අනුනායක ආණමඩුවේ ධම්මදස්සි හිමියෝ කියා සිටියහ.

02 පිටුවට

## මාස දෙකේ සුරතලා අවු 12 සිසුවාගේ පණ ඩැහැ ගනී

■ සුනිල් පියතිලක -කුරුවිට

නිවසේ සුරතලයට ඇතිකළ මාස දෙකක වයස සුනඛයකුගේ සපා කෑමට ලක්ව රත්නපුර ශික්ෂණ රෝහල වෙත ඇතුළත් කළ 12 හැවිරිදි පාසල් සිසුවකු ජලභීතිකා රෝගය වැළඳීමෙන් පෙරේද (05 වැනිද) ජීවිතක්ෂයට පත්ව තිබේ.

02 පිටුවට

## සිමෙන්ති රු.300කින් බහී

■ චාමර පල්ලේගෙදර

කිලෝ ග්‍රෑම් 50 සිමෙන්ති කොට්ටයක මිල රුපියල් 300කින් අඩු කිරීමට පියවර ගෙන ඇත. ඒ අනුව රුපියල් 2600ක්ව පැවති කිලෝ ග්‍රෑම් 50 සිමෙන්ති කොට්ටයක නව මිල රුපියල් 2300ක් වේ.

02 පිටුවට







රටින් බීත්තර ගේන එක නවත්තනව කියල අමරවීර කියනව

පිලච් රට යැව්ව වගේද සර්

## තරුණියගේ නිරුවත FB දමනවැයි කිව්වහම ගමක් ඇවිස්සිලා

### තරුණයන් දෙදෙනාට පහර දුන් 58ක් අල්ලයි

■ එෆ්.අස්ලම්

යාපනය අච්චුවේලි ප්‍රදේශයේ පුද්ගලයන් දෙදෙනකුට හා නිවාස දෙකකට පහරදී බරපතළ හානි කිරීමේ සිද්ධියකට අදාළව අච්චුවේලි පුතූර් ගම්මානයේ පදිංචි කාන්තාවන් තිස් නව දෙනකු ඇතුළු පනස් අට දෙනකු අත්අඩංගුවට ගෙන තිබේ.

02 පිටුවට

## සතුන්ගේ ලෙඩට දුකට පිහිට වෙන්න ඇප් එකක්



■ සාලිය කුමාර ගුණසේකර

නිවසේ සහ ගොවිපොළවල ඇති කරන සතුන්ගේ තොරතුරු සහ ප්‍රතිකාර සම්බන්ධ දත්ත ඇතුළත් කළ හැකි නව යෙදුමක් (App) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ (SLIT) මහාචාර්යවරයකු විසින් හඳුන්වාදී ඇත.

02 පිටුවට

## ලාෆ් ගෑසුත් ගණන් බස්සයි




■ චාමර පල්ලේගෙදර

මාස තුනකට පසුව කිලෝ ග්‍රෑම් දෙළහයි දශම පහේ ලාෆ් ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 300කින් අඩු කිරීමට එම සමාගම පියවර ගෙන ඇත.

02 පිටුවට

## බුදු පුතුගේ රැකවරණය මැද පන්සලේ විසූ ගිලන් මව දිවි හැර යයි

■ අනීෂා මානගේ

ස්වාමීන්වහන්සේ නමක විසින් වසර දහතුනක් තිස්සේ පන්සලේ තබාගෙන රැකබලාගත් රෝගී මවක මියගිය පුවතක් හක්මන නරවැල්පිට ප්‍රදේශයෙන් වාර්තා වේ. හක්මන නරවැල්පිට තෝරාවිට පුරාණ රාජමහා විහාරාධිපති පොළොන්නරුවේ සිරිවිමල හිමියන්ගේ මව 2011 වර්ෂයේදී අසනීප වීම හේතුවෙන් එදින පටන් ඇය රැකබලාගෙන ඇත්තේ ස්වාමීන්වහන්සේ විසිනි.

02 පිටුවට



දේහය පන්සලේ තැන්පත් කර තිබූ අයුරු

## කාසිවලට රාග සිත් නිවූ නැම්බියන් මාට්ටු

■ එෆ්.අස්ලම්

විශ්‍රාමික පොලිස් අධිකාරිවරයකුට අයත් වව්නියාවේ ගොඩනැගිල්ලක පවත්වාගෙන ගිය ගණිකා නිවාසයක් වැටලූ වව්නියාව මූලස්ථාන පොලිසිය එහි සිටි තරුණියන් තිදෙනකු ඇතුළු පස් දෙනකු පෙරේද (05 වැනිද) අත්අඩංගුවට ගෙන තිබේ.

02 පිටුවට

## වන් ගෝල් ෆේස් ඉන්දීය අවන්හලේ පිහි ඇනුමකින් සේවකයකු මරුට

■ එෆ්.අස්ලම්, ඉෂාර රත්නකාර

කොළඹ වන් ගෝල් ෆේස් සුපිරි වෙළෙඳ සංකීර්ණයේ පිහිටි ඉන්දීය ආහාර අවන්හලක කළමනාකාරවරයකු එහි සේවය කරන ඉන්දීය ජාතික සේවකයකුට තියුණු ආයුධයකින් ඇන ඝාතනය කර තිබේ.

02 පිටුවට

## ලැගුම් හලේදී මිය ගිය තරුණිය අවසන් ගමන් යද්දී පොලිසියට ජනතා විරෝධය

02 පිටුවට

# නපුරු "කැසොවරි" දෙහිවලට


තායිලන්තයෙන් ලැබුණු කැසෝවරි

■ සාලිය කුමාර ගුණසේකර
■ ටී.කේ.ජී. කපිල - කටුනායක

ඉන්දියාවේ ජාතික සත්වෝද්‍යානය සමග කරන ලද සත්ත්ව හුවමාරු වැඩසටහනකින් අනතුරුව මෙරටට කැසොවරි (Double Wattled Cassowary) පක්ෂීන් තිදෙනකු දෙහිවල ජාතික සත්වෝද්‍යානයට ලැබී ඇතැයි ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තිලක් ප්‍රේමකාන්ත ප්‍රකාශ කළේය.

මෙම කැසොවරි පක්ෂීන් ද්විත්ව කරමල් සහිතය. තායිලන්තයේ සිට මෙම සතුන් මෙරටට එවා තිබිණි.

මාස නවයක් පමණ වයසැති පිරිමි කැසොවරි කුරුල්ලන් දෙදෙනකු සහ එක් කැසොවරි කිරිල්ලියක ඉකුත්ද (05 වැනිදා) රාත්‍රී මැලේසියාවේ ක්වාලාලම්පූර් නුවර සිට ගුවන් යානයකින් කටුනායක ගුවන් තොටුපොළ වෙත එවා තිබිණි.

උස අඩි පහක් සහ කිලෝ ග්‍රෑම් හැටක් පමණ බරක් දක්වා වර්ධනය වන මෙම කැසොවරි කුරුල්ලන් ලෝකයේ නපුරුම කුරුල්ලන් ඝනයට අයත් වේ. ලෝකයේ දෙවන විශාලතම පක්ෂීන් කාණ්ඩය ලෙසින් ද හඳුන්වා තිබේ. ඉතාම වර්ණවත් මෙම කුරුල්ලන්ට පියාඹිය නොහැකි වීම විශේෂත්වයකි.


සතුන් මෙරටට රැගෙන එමින්.....

මෙම සත්ත්ව හුවමාරු වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවෙන් සත්ත්ව විශේෂ එකොළහක් ඉන්දියාවට යැවීමට නියමිතය. ඒ අතර මීමින්නන්, කළු වඳුරන්, රිළවුන්, වලිකුකුළන් සහ තවත් සර්ප විශේෂ කීපයක් ද වේ. ඉන්දියාවෙන් මෙරටට සත්ත්ව විශේෂ දහතුනක් එවීමට ද නියමිතය.

නෙදර්ලන්තයේ ජාතික සත්වෝද්‍යානයෙන් පසුගියද මෙරටට ජගුවර් සතෙකු ලබාදී තිබූ අතර එම සත්ත්වයා වෙනුවට මෙරටින් දඹු ලේනුන් හතරදෙනකු එරට සත්වෝද්‍යානය වෙත ලබා දී තිබිණි.

# රෙදි කඩේ සේප්පුවට බැස්ස හොරා තවම හැංගිලා


සැකකරු වෙළෙඳ ප්‍රදර්ශනාගාරයට ඇතුළු වී සේප්පුව අසල සිටින අයුරු


වෙළෙඳසල තුළ සැරිසරන සැකකරු

■ බිමල් ජයසිංහ - බණ්ඩාරගම

හොරණ නගරයේ පිහිටි සුපිරි වෙළෙඳ ප්‍රදර්ශනාගාරයකට රාත්‍රි කාලයේදී ඇතුළු වූ පුද්ගලයකු එහි වූ දේපළ සොරා ගෙන යන ආකාරය වෙළෙඳසලේ සවි කර තිබූ ආරක්ෂිත කැමරාවක සටහන්වී තිබිණි.

පස් මහල් ගොඩනැගිල්ලක තෙවන මහලේ පිහිටි මෙම ප්‍රදර්ශනාගාරය වෙත පැමිණෙන පුද්ගලයා වීදුරු දෙරවල් සූක්ෂම ලෙස ගලවා ඊට ඇතුළු වන ආකාරයත් මුදල් බහාලන සේප්පුව අසල සැරි සරන ආකාරයත් ආරක්ෂිත කැමරාවේ පැහැදිලිව සටහන් වී තිබූ බව පොලිසිය සඳහන් කළේය.




පසුව පැයක දෙකකට ආසන්න කාලයක් ප්‍රදර්ශනාගාරයේ රැඳී සිටි සැකකරු ලක්ෂ විසි පහක් පමණ වටිනා ඉලෙක්ට්‍රොනික් මුදල් ලාච්චු පහක් කඩා බිඳ දමමින් රුපියල් ලක්ෂ දෙකක මුදල් සහ රුපියල් ලක්ෂ දෙකක් පමණ වටිනා රෙදිපිළි සහ අත්ඔරලෝසු සොරා ගෙන ගොස් ඇති බව පොලිසිය කළ මූලික පරීක්ෂණවලදී අනාවරණය වී තිබිණි. සැකකරු විසින් අත්ඔරලෝසු සොරා ගැනීම පිණිස වීදුරු කුටි කිහිපයකටද අලාභ හානි සිදු කර ඇතැයි පරීක්ෂණ පැවැත්වූ පොලිසිය සඳහන් කරයි.

මෙම සොරකම සිදු කළ සැකකරු සම්බන්ධයෙන් තොරතුරක් දන්නේ නම් දැනුම් දෙන ලෙස හොරණ පොලිසිය ඉල්ලා සිටී.

# තේක්කවත්ත කුණු කන්දත් හරිත කලාපයක්

■ කමල් සුරවීර - මහනුවර

තේක්කවත්ත කසළ අංගණයේ ස්ථාවර කොට පරිසර හිතකාමී කලාපයක් බවට පත් කිරීමේ දෙවැනි අදියර 2024 සිට ක්‍රියාත්මක කිරීමට මහනුවර මහ නගර සභාව සැලසුම් කොට තිබේ.

ඒ අනුව මෙම අංගණයට බැහැර කරන කසළ කළමනාකරණය කර ගනිමින් 2024 සිට 2034 දක්වා දස වසරක කාලය තුළ හරිත කලාපයක් බවට පත් කිරීමටද නියමිතය.

එම කසළ අංගණයේ ඉකුත් දස වසරක කාලයේ රුපියල් කෝටි නවයක වියදමින් සිදු කරන ලද සංවර්ධන ව්‍යාපෘති හා දැනට සිදුවන ව්‍යාපෘති පිළිබඳ මධ්‍යම පළාත් ආණ්ඩුකාර නීතිඥ ලලිත් යූ. ගමගේ සහ දිස්ත්‍රික් ලේකම් චන්දන තෙන්නකෝන්ගේ නිරීක්ෂණයට ලක් වූවේය.

මහනුවර නගරයෙන් මෙට්‍රික් ටොන් අසූවක් හා හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ ටොන් තිහක් වශයෙන් දෛනිකව ලැබෙන කැළිකසළ ටොන් එකසිය දහයක් පමණ මෙම අංගණය වෙත දිනපතා බැහැර කෙරේ.

ඒ අනුව දැනට වර්ග කරන ලද කැළි කසළ මගින් කොම්පෝස්ට් පොහොර නිපදවීම, ගව පාලනය හා ජීව වායු නිෂ්පාදනය සහ කුණු කන්ද ස්ථාවර කිරීම මේ වන විට සිදුකොට තිබේ.


ආණ්ඩුකාරවරයාගේ නිරීක්ෂණයට ලක්වූ කසළ අංගණය


-තේක්කවත්ත කසළ අංගණය වෙත රැගෙන එන කුණු කසළ

# "කියවන මුද්දර" අලුත් පිටුවක් පෙරළයි

■ ඉන්දික සංජීව විතාන - හොරණ

පොඩි කාලෙදී තිබුණු විනෝදාංශ අතරින් වැඩියෙන්ම ජනප්‍රිය වුණේ "මුද්දර එකතු කිරීම" කිව්වොත් වඩාත් නිවැරදිය. පිළිවෙළට පොතක මුද්දර ටික අලවලා, එහෙමත් නැත්තන් ඇල්බම් එකක දාගෙන ගිහින් තමන්ගේ ළඟ ඇති නැති මුද්දර හොයලා යාළුවොත් එක්ක මාරු කරගත්ත හැටි කාගෙත් මතකයේ තියෙනවා නොඅනුමානය. මෙසේ මුද්දර ගැන කතාකරද්දී ලංකාවේ පළමුවැනි මුද්දරේට දැන් හරියටම අවුරුදු එකසිය හැටක් පිරෙන්නේය. එද ඉඳන් අද වෙනකම් බිහිවුණු මුද්දර සලකලා බැලුවාම හොඳින් පැහැදිලි වෙන කාරණාවක් තමයි ඒවායේ තියෙන කාලීන බව. හැම මුද්දරේකටම පසුබිම් වෙලා තියෙන්නේ ඒ ඒ කාලයේ සිදු වුණු දේවල් කීවොත් නිවැරදිය. මුද්දර විනෝදාංශයෙන් ලෝකය දකින්නටත් තොරතුරු ගවේෂණය හා අධ්‍යනය පිළිබඳ ඇල්මක් දක්වන්නන් හට හොරණ, නම්බපාන කනිෂ්ඨ විද්‍යාලයේ දී අපූරු වැඩසටහනක් පසුගියද ආරම්භ විණි.


නම්බපාන පාසලේ දරුවෝ මුද්දර කියැවීමේ වැඩසටහනට සහභාගී වී සිටි අයුරු


එය නම් කර තිබුණේ "කියවන මුද්දර" ලෙසිනි.

හොරණ අධ්‍යාපන කලාපයේ පළාත් සභා පාසලක පවත්වන ලද ප්‍රථම මුද්දර කියවීමේ වැඩසටහන ලෙසින්ද හැඳින්වීමට හැකි බව "කියවන මුද්දර" වැඩසටහනේ නිර්මාතෘ නිරෝෂණ පීරිස් කියා සිටියේය.

ශ්‍රී ලංකාවේ තැපැල් සහ මුද්දර ඉතිහාසය, මුද්දරය ඉගෙනුම් ආධාරකයක් ලෙස දරුවනට සහ ගුරුවරුන්ට භාවිත කිරීමේ විභවයන්, විෂය සමගාමී කටයුත්තක් ලෙස මුද්දර එකතු කිරීම සහ මුද්දරයක් කියවන්නේ කෙසේද යන්න පිළිබඳව එහිදී දරුවෝ වෙත මෙහිදී කියා දුන්හ. එදිනෙද ඉගැන්වීමේදී තැපැල් මුද්දර භාවිතය පිළිබඳව නිදසුන් සහිතව පෙන්වා දුන් අතර කුඩා පන්ති කාමර ව්‍යාපෘති ලෙසින් දරුවන්ට ඉගැන්වීමේ කලාව සහ ඒ හරහා නිර්මාණශීලී වීම සඳහා අවස්ථාව විවර කර දීමට එහිදී හැකියාව ලබා දී තිබිණි.



විදුහල්පතිනි කාංචනා පෙරේරා මෙම වැඩසටහන සංවිධානය කළ අතර මෙම වැඩමුළුව සඳහා නියෝජ්‍ය විදුහල්පතිනිය ඇතුළු ගුරු මණ්ඩලයත්, පාසල් දූවා දරුවෝ ඇතුළු විශාල පිරිසක් සහභාගි වූහ.



01 වැනි පිටුවෙන්...

## රාජකාරි පැහැර හැරි...

අදාළ වෛද්‍යවරු තිදෙනාගේ නොපැමිණීම සම්බන්ධයෙන් රෝහල් බලධාරීන් සෞඛ්‍ය අමාත්‍යාංශයටද දැනුම් දීමක් සිදුකළද මෙතෙක් එම වෛද්‍යවරිය ඇතුළු වෛද්‍යවරු තිදෙනාට අදාළව කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව වාර්තා වෙයි.

කෙසේ වුවද මේ වනවිට එම වාට්ටුවේ ප්‍රතිකාර කටයුතු සිදුකරනු ලබන්නේ සීමාවාසික වෛද්‍යවරුන් බවත් එය දරුවන්ගේ ජීවිතවලට අවදානමක් ඇති කරන බවත් රෝහල් බලධාරීහු පවසති.

රිජ්වේ ළමා රෝහලේ අටේ වාට්ටුවේ රෝගී දරුවන් පනස් දෙනෙකු පමණ ප්‍රතිකාර ගනු ලබයි.

රෝහලේ සේවයේ නියුතු විශේෂඥ වෛද්‍යවරියක් සැර පරුෂ බව පවසමින් පසුගිය විසි එක්වැනිද (21) සිට ළමා රෝගීන් බැලීමට මෙම වෛද්‍යවරු තිදෙනා අටේ වාට්ටුවට පැමිණ නැත.

රෝහලේ සේවය කරනා එම විශේෂඥ වෛද්‍යවරිය රෝහල් කාර්ය මණ්ඩලය සමග සැර පරුෂ ලෙස කටයුතු කළද ළමා රෝගීන් පරීක්ෂා කිරීමේදි එවැනි ගැටලුවක් නොමැති බවද වාර්තා වෙයි.

කෙසේ වුවද මෙම විශේෂඥ වෛද්‍යවරයාගේ හැසිරීම සම්බන්ධව රෝහල් අධ්‍යක්ෂවරයාට පැමිණිලි ලැබී ඇති අතර රෝහල් අධ්‍යක්ෂවරයා ඒ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත දැනුම් දීමක් කර ඇත.

ඒ අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අදළ විශේෂඥ වෛද්‍යවරයා සම්බන්ධයෙන් අභ්‍යන්තර පරීක්ෂණයක් පවත්වමින් සිටියි.

එසේ පරීක්ෂණයක් පවත්වමින් සිටින වාතාවරණයක් තුළ මෙම වෛද්‍යවරු තිදෙනා ළමා රෝගීන් බැලීමට වාට්ටුවට නොපැමිණීම අනුමත කළ නොහැකි බව රෝහල් අධ්‍යක්ෂ වෛද්‍ය ජේ. විජේසූරිය මේ සම්බන්ධව අදහස් දක්වමින් ප්‍රකාශ කළේය.

ඒ අනුව රෝහල් අධ්‍යක්ෂවරයා මෙම වෛද්‍යවරු තිදෙනාට සේවයට පැමිණෙන ලෙස දැනුම් දී ඇති අතර එහිදි අදළ වෛද්‍යවරු තිදෙනා පවසා ඇත්තේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යාලයේ සේවයට වාර්තා කරන බවත් ඒ සඳහා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා අනුමැතිය ලබා දී ඇති බවත්ය.

එසේ පවසමින් රෝහල් අධ්‍යක්ෂවරයා සමග මෙම වෛද්‍යවරු තිදෙනා බහින් බස් වීමක්ද සිදුකර තිබේ.

රෝහල් බලධාරීන් පවසන්නේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන මේ සම්බන්ධව කිසිදු දැනුම්දීමක් අදළ වෛද්‍යවරු තිදෙනාට සිදුකර නොමැති බවය.

## මාස දෙකේ සුරතලා...

මෙලෙස මියගොස් ඇත්තේ කුරුවිට කඳන්ගොඩ විද්‍යාලයේ ඉගෙනුම ලැබූ පාසල් සිසුවෙකි.

මෙම සිසුවා සුනඛයා සපා කෑ බවට දෙමාපියන්ට වසං කර තිබෙන බවත් සුනඛයා සපා කෑ නිශ්චිත දිනයක් හෝ නොදන්නා බවත් ඒ අනුව අපරීක්ෂාකාරීව කටයුතු කිරීම නිසා සිසුවාට ජලභීතිකා රෝගය උත්සන්න වී රෝහල්ගත කර තිබෙන බවත් කුරුවිට ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ඉන්දික කරුණාරත්න පැවසීය.

එම සුනඛයා ප්‍රදේශයේ තවත් පුද්ගලයන් දෙදෙනකු සපා කා ඇති බවත් ඉන් දින කිහිපයකට පසු සුනඛයා මිය ගියත් සුනඛයාගේ සපා කෑමට ලක්වූ පුද්ගලයන් දෙදෙනා ජලභීතිකා එන්නත් ලබාගැනීම නිසා ඔවුන්ගේ ජීවිත බේරී ඇති බවද අධ්‍යක්ෂවරයා කීවේය.

මෙම දරුවාද නියමිත පරිදි ජලභීතිකා එන්නත් ලබාගෙන තිබුණේනම් මෙවන් අවාසනාවන්ත මරණයකට ගොදුරු නොවීමට ඉඩතිබූ බවද හෙතෙම කීවේය.

මේ සම්බන්ධයෙන් අදහස් දැක් වූ කුරුවිට හා එරත්න භාර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් වන විත්තක ජයසිංහ හා ප්‍රදීප් කුමාරසිංහ යන නිලධාරීන් සඳහන් කළේ රෝහල්, පන්සල් , පාසල් ආශ්‍රිත භූමි ප්‍රදේශ අයාලේ යන සුනඛයන්ගේ රජ දහන් බවට පත් වී තිබීමෙන් අනතුරුදයක තත්වයක් මතුවී ඇති බවය.

සුනඛයන්ට එවන් ස්ථානවල ප්‍රමාණවත් ආහාර තිබීම නිසා මෙම තත්වය මතුව ඇති බැවින් ඒ පිළිබඳ දැඩි අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටින මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සුරතලයට ඇතිකරන සුනඛයන්ට වසරින් වසර නියමිත පරිදි එන්නත්කරණය සිදුකරන ලෙසද අවධාරණය කරති.

## සිමෙන්ති...

සිමෙන්ති සමාගම් සහ වෙළෙඳ ඇමැති නලින් ප්‍රනාන්දු සමග පසුගිය දිනවලදී පැවති සාකච්ඡාවලින් අනතුරුව මෙලෙස සිමෙන්ති කොට්ටයක මිල පහත හෙළීමට තීරණය කර තිබේ.

ඊට සමගාමීව යකඩ, ගල්, තීන්ත වර්ගවල මිල ගණන්ද පහත හෙළීමට කර්මාන්තකරුවන් එකඟතාව පළ කළ බව වෙළෙඳ ඇමැති නලින් ප්‍රනාන්දු පැවසීය.

පසුගිය මැයි 13 වැනිදද කිලෝ ග්‍රෑම් 50 සිමෙන්ති කොට්ටයක මිල රුපියල් 150කින් අඩු කෙරිණි.

නම් වෙනස් කිරීමයි


ජාතික සංවර්ධන ලොතරැයි මණ්ඩලය National Lotteries Board
බදාදා 2023.07.05 ඇදුම් ප්‍රතිඵල www.nlb.lk NLB
මහජන සම්පත — දිනුම් වාරය : 5166 — රු. 20,000,000.00 — V 3 3 8 7 0 3
ගොවිසෙත — 3408 — රු. 68,014,888.00 — P 33 50 76 77
ජාතික සම්පත — 1621 — රු.13,251,889.52 — 8 0 6 6 0 0
ධන නිධානය — 1196 — රු. 98,105,200.80 — T 02 15 57 67
හඳහන — 475 — රු. 2,618,204.20 — 21 34 35 48
Mega Power — 1514 — Rs.400,000,000.00 — P 21 28 38 44 64


# මහ වැස්සට ගල් පෙරළීමේ අවදානමක්



සාලිය කුමාර ගුණසේකර/ බිමල් ජයසිංහ - බණ්ඩාරගමෑ මනුර සුදත් සෙල්ලහේවා - හැටන්/ සිතාර ඉරාෂ් -වටවල/ ඉන්දික සංජීව විතාන - හොරණ/ ආර්.එෆ්.එම්.සුහෙල් - නුවරඑළිය/ ධනුෂ්ක ලංකා නානායක්කාර - අගලවත්ත/ සුනිල් පියතිලක - කුරුවිට

පවතින අධික වැසි හේතුවෙන් දින කිහිපයක සිට පස ජලයෙන් සංතෘප්තව පවතින හෙයින් ඕනෑම අවස්ථාවක පස් කණ්ඩි කඩාවැටීමේ සහ ගල් පෙරළීමේ අවදනම් තත්ත්වයක් පවතින බව ජාතික ගොඩනැගිලි පරේයෂණ සංවිධානය අනතුරු අඟවයි.

අවට පරිසර පද්ධතියේ ගස්, විදුලි, දුරකථන කණු ඇලවීම්, භූමියේ හදිසි ඉරි තැළීම්, ජල උල්පත් මතුවීම් හෝ ජල උල්පත් එකවර සිඳීයාම් සම්බන්ධව දැඩි අවධානයක් යොමු කරන ලෙසත් එවැනි තත්ත්වයක් නිරීක්ෂණය වුවහොත් වහා ආරක්ෂිත ස්ථානවලට යොමුවන ලෙසත් එම සංවිධානයේ ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ ආචාර්ය වසන්ත සේනාධීර මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව හා නුවරඑළිය සහ රත්නපුර දිස්ත්‍රික්කයේ ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට ජාතික ගොඩනැගිලි පරේයෂණ සංවිධානය විසින්ත වදුරටත් නායයෑමේ අනතුරු ඇඟවීමේ නිවේදන නිකුත් කර ඇත.

මේ අතර දිවයිනේ නිරිත දිග ප්‍රදේශවලට පැවැති වැසි තත්ත්වයේ යම් අඩුවීමක් ඊයේ (06 වැනිද) සිට වාර්තා වන බව ද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

01 වැනි පිටුවෙන්...

## දින 186කදී...

### අලි-මිනිස් ගැටුම භංග කරන්න ජාතික වැඩපිළිවෙලක්

මෙම කාලය තුළදී අලි මිනිස් ගැටුම හේතුවෙන්, අලින්ගේ පහරදීම්වලට ලක්ව මියගිය පුද්ගලයන් සංඛ්‍යාව 82 කි.

අලි මිනිස් ගැටුමට කෙටි කාලීන මධ්‍ය කාලීන හා දිගු කාලීන ස්ථිරසාර විසඳුම් ලබාදීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සහ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන ලෙස වනජීවී හා වන සම්පත් සංරක්ෂණ ඇමතිනී පවිත්‍රා වන්නිආරච්චි නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත.

අලි මිනිස් ගැටුම කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් ඊට අදළ සියලුම ආයතන ඒකාබද්ධ කර ගනිමින් ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පසුගියද සාකච්ඡාවක් පැවැති අතර, එහිදී ඇමැතිවරිය මේ බව කියා සිටියාය.

අලි මිනිස් ගැටුම විසඳීම සම්බන්ධයෙන් වූ ජාතික ප්‍රතිපත්තිය හා වැඩපිළිවෙළ පාර්ලිමේන්තුව තුළ විවාදයට බඳුන් කළයුතු බවද ඇය පැවසුවාය.

## තරුණියගේ නිරුවත...

අච්චුවේලි පුතූර් ප්‍රදේශයේ තරුණයකු එම ප්‍රදේශයේම පදිංචි කාන්තාවකගේ නිරුවත් ඡායාරූප සමාජ මාධ්‍ය වෙත මුදහරින බවට කරන ලද තර්ජනයක් හේතුවෙන් කලෙයිකුරා ගම්මානයේම පිරිසක් පසුගිය (29 වැනිද) පුතූර් ප්‍රදේශය වෙත පැමිණ ඇත.

මේ අනුව පුතූර් ප්‍රදේශයේ පදිංචි එම තරුණයාට සහ ඔහුගේ මිතුරකුටත් පහරදී ඇති අතර ඔවුන්ගේ නිවාසවලට හා දේපළවලට ද හානි කර ඇත.

මෙම තත්වය සමතයට පත්කිරීම සඳහා අච්චුවේලි පොලිසිය පැමිණියත් කළහකාරී ලෙස හැසිරුණු පිරිස් පොලිසියටද පහරදීමට උත්සාහ දරා ඇත. මේ අතරතුර පොලිස් නිලධාරියකුද පහරකෑමට ලක්ව තුවාල ලබා තිබිණි.

තත්වය පාලනය කිරීම සඳහා පොලිසිය අහසට වෙඩි තබා තිබුණු අතර කළහකාරි ලෙස හැසිරුණු 34 දෙනකු එදිනම අත්අඩංගුවට ගෙන තිබිණි.

එමෙන්ම පහර කෑ තරුණයන් දෙදෙනාද පොලිස් ආරක්ෂාව යටතේ රෝහල් ගතකර තිබිණි.

අත්අඩංගුවට ගත් සැකකරුවන් හා සැකකාරියන්ගෙන් කරන ලද ප්‍රශ්න කිරීම්වලට අනුව පහරදීම සඳහා පැමිණි තවත් 24 දෙනකු හඳුනාගෙන අත්අඩංගුවට ගත් බව අච්චුවේලි පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක කේ. ප්‍රියන්ත සඳහන් කළේය.

මේ අනුව සියලු සැකකරුවන් හා සැකකාරියන් අත්අඩංගුවට ගත් බවත් ඔවුන් සියලු දෙනාම එකම ගම්මානයේ අය බවත් කී පොලිස් ස්ථානාධිපතිවරයා සියලු දෙනා ලබන 12 වැනිද තෙක් රක්ෂිත බන්ධනාගාර ගතකර තිබේ.

## කාසිවලට රාග සිත් නිවූ...

මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ අනුරාධපුර, ගල්ගමුව, වව්නියාව යන ප්‍රදේශවල පදිංචි තරුණියන් සිවු දෙනකු සහ ගණිකා නිවාසයේ කළමනාකරු බව වව්නියාව පොලිසිය සඳහන් කරයි.

වව්නියාව මූලස්ථාන පොලිසියට ලද තොරතුරකට අනුව යාපනය - මහනුවර ප්‍රධාන මාර්ගයේ වව්නියාව තේක්කවත්තේ පිහිටි මෙම ලැගුම්හල පෙරේද රාත්‍රියේ වැටලීමට ලක්කර තිබිණි. පොලිස් උපාය දූතයකු යොදවමින් අදළ වැටලීම සිදුකර තිබෙන අතර එහි සිටි කාන්තාවන් රුපියල් තුන්දහස, පන්දහස වැනි මිල ගණන්වලට අලෙවි වී තිබේ.

විවිධ පුද්ගලයන් නිරන්තරයෙන් මෙම ස්ථානයට පැමිණෙන බවට ප්‍රදේශවාසීන්ගෙන් තොරතුරු රැසක් ලැබී තිබුණු බවද පොලිසිය සඳහන් කරයි.

මෙම ලැගුම්හල පිහිටි ගොඩනැගිල්ල අයත් හිටපු පොලිස් අධිකාරිවරයා මෙම ගණිකා ජාවාරමට සම්බන්ධ නොවන බවත් ඔහු මෙම ගොඩනැගිල්ල කුලී පදනම මත ලබාදී තිබෙන බවත් වව්නියාව පොලිසියේ ප්‍රකාශකයකු සඳහන් කළේය.

මෙම සැකකාරියන් සිවු දෙනා ඇතුළු පස් දෙනාම ඊයේ වව්නියාව මහෙස්ත්‍රාත් අධිකරණය හමුවට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

## බුදු පුතුගේ රැකවරණය...

සිරිවිමල හිමියන්ට වයස අවුරුදු අටක් පමණ වන කාලයේදී පියා මියගොස් ඇති අතර සහෝදර සහෝදරියන් හය දෙනකුගෙන් යුතු පවුලේ බාලයා ඔහු විය. ඉන් පසුව 2000 වසරේදී පොළොන්නරුවේ සිරිවිමල නමින් නරවැල්පිට තෝරාවිට පුරාණ රාජමහා විහාරයේදී පැවිදි ජීවිතය ආරම්භ කළ උන්වහන්සේගේ මව 2011 වර්ෂයේදී හදිසියේ රෝගාතුර වී ඇත. මව සුවපත් කර ගැනීමේ අරමුණින් කොළඹ අවට විහාරස්ථානවල වැඩ වාසය කරමින් ඇයව ප්‍රතිකාර සඳහා රැගෙන ගියද ගුරු හාමුදුරුවන් වහන්සේගේ හදිසි ගිලන් වීම නිසා උන්වහන්සේට උපස්ථාන කිරීමේ වගකීමද සිරිවිමල හිමියන්ට පැවරිණි. ඒ වන විට විශ්වවිද්‍යාල අධ්‍යාපනය හදරමින් සිටියද ඉන් ඉවත් වී මවත් සමග 2016 වර්ෂයේදී තෝරාවිට පුරාණ විහාරයට උන්වහන්සේ වැඩම කළහ.

විහාරස්ථානයේ රඳවාගෙන රැකබලාගත්තද ඇයගේ රෝගී තත්ත්වය උත්සන්න වීම හේතුවෙන් උන්වහන්සේගේ මව වන හැත්තෑපස් හැවිරිදි ඩී.එම්. හින්නිහාමි මහත්මිය පෙරේද (5) මිය ගියාය. ඇයගේ දේහය නරවැල්පිට තෝරාවිට පුරාණ රාජමහා විහාරස්ථානයේ සංඝාවාසයෙහි තැන්පත් කළ අතර අද (7) පස්වරුවේ ඇගේ අවසන් කටයුතු හක්මන ආදහනාගාරයේදී සිදුකිරීමට නියමිතව තිබිණි.

## ලාෆ් ගෑසුත්...

ඒ අනුව රුපියල් 3990ක්ව පැවති කිලෝ ග්‍රෑම් දෙළහයි දශම පහේ ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක නව මිල රුපියල් 3690ක් වේ.

එමෙන්ම කිලෝග්‍රෑම් 5ක සිලින්ඩරයක මිල රුපියල් 120කින් පහත හෙළීමත් සමග එහි නව මිල රුපියල් 1,476 සහ කිලෝග්‍රෑම් 2 දශම 3ක සිලින්ඩරයක මිල රුපියල් 37කින් අඩු වීමත් සමග එහි නව මිල රුපියල් 561ක් වේ.

අවසන් වරට ලාෆ් ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක මිල අඩු කරනු ලැබුවේ අප්‍රේල් 04 වැනිද වන අතර එලෙස අඩු කරනු ලැබුවේ කිලෝ ග්‍රෑම් දෙළහයි දශම පහේ ලාෆ් ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක් රුපියල් 1290කින්ය.

එහෙත් තවමත් කිලෝ ග්‍රෑම් දෙළහයි දශම පහේ ලිට්‍රෝ ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක මිලට සාපේක්ෂව ලාෆ් ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 708කින් වැඩිය.

ඒ අනුව කිලෝ ග්‍රෑම් දෙළහයි දශම පහේ ලිට්‍රෝ ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 2982ක් වේ.

## සතුන්ගේ ලෙඩට දුකට...

මෙම යෙදුම "Pet Pulz"යනුවෙන් නම්කර තිබේ. වසර හතරකට වැඩි කාලයක් තිස්සේ කරන ලද අධ්‍යයනවලින් අනතුරුව මෙම යෙදුම හඳුන්වාදී තිබේ.

මෙම යෙදුම නිර්මාණය කර ඇත්තේ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ (SLIT) මහාචාර්ය කෝලිය පුලසිංහ ඇතුළු කණ්ඩායමක් විසිනි.

"Pet Pulz" යෙදුම ජංගම දුරකථනය ඔස්සේ ගූගල් ඩ්‍රයිව් මගින් බාගත කරගත හැකි අතර, නිවසේ ඇති කරන බල්ලා, පූසා ආදී සතුන්ගේ පමණක් නොව ගිරව් ආදී පක්ෂීන් ඇතුළත් කරන්නේනම් එම පක්ෂීන්ගේ තොරතුරුද ඡායාරූපයක් සහිතව මෙම යෙදුමට ඇතුළත් කළ හැකිය.

මෙම යෙදුම පේරාදෙණිය විශ්ව විද්‍යාලයයේ සත්ව රෝහලේ සහ කොළඹ පෞද්ගලික සත්ව රෝහලක භාවිත කෙරෙන බව මහාචාර්ය කෝලිය පුලසිංහ කීවේය.

මෙහිදී, මෙම රෝහල්වලට ප්‍රතිකාර සඳහා යොමු කෙරෙන රෝගී සතුන්ගේ දත්ත අදළ යෙදුමට එකතු කෙරෙන අතර, එහි සතාගේ රෝග තත්වයන්, ප්‍රතිකාර ආදී කරුණු ඊට ඇතුළත් කෙරේ. ඒ අනුව, එම සත්වයාට යළි ප්‍රතිකාර කිරීමේදී පසුගිය තොරතුරු පශු වෛද්‍යවරයාට පහසුවෙන් යෙදුම හරහා බලාගැනීමේ පහසුකම සැලසේ.

මෙම යෙදුම සඳහා මේ වනවිට සතුන් 5000 කගේ පමණ තොරතුරු ඇතුළත් කර ඇතැයිද මහාචාර්යවරයා කීවේය.

## හීලෑ අලි-ඇතුන් හිඟ වීම...

අලියෙක් පිටරටකට රැගෙන යද්දී කෑගැසීමට ,කඳුළු හෙළීමට බොහෝ දෙනකු සිටියද, හීලෑ අලි ඇතුන් කොපමණ සිටිනවාදැයි සෙවීමට කිසිවකු නොමැති බව උන්වහන්සේ පැවසූහ. මහනුවර ශ්‍රී දළඳ මාලිගාවේ බහුකාර්ය ගොඩනැගිල්ලේ දී පෙරේද (05 වැනිද) පැවැති පෙරහර සාකච්ඡාවේ දී අනුනාහිමියෝ මේ බව පැවසූහ.

එක අලියෙක් පිට රටකට ගෙන ගිය පසු ඒ සම්බන්ධයෙන් හඬනගා මෙරට බෞද්ධ සංස්කෘතියට පහර ගැසීමට උත්සාහ කරන පිරිස මේ රටේ සංස්කෘතිය ආරක්ෂා කිරීම සඳහා වචනයක් හෝ කථා නොකරන බවද උන්වහන්සේ කියා සිටියහ. "මේ වනවිට අපේ රටේ පෙරහර සංස්කෘතිය ඉදිරියට පවත්වාගෙන යෑමට නොයෙකුත් බාධා මතුවෙමින් තිබෙනවා. ඉන් එක් ප්‍රධාන ප්‍රශ්නයක් තමයි හීලෑ අලි ඇතුන්ගේ හිඟය. අලි බලන්න හිතාගෙනම පෙරහරට එන අය ඉන්නවා. ඒත් අලි ඇතුන් අපිට කොච්චර ඉන්නවාද කියලා හොයන්න කවුරුවත් නැහැ.

## ලැගුම් හලේදී මිය ගිය...

ඉන්දික වික්‍රමආරච්චි -රක්වාන

රක්වාන පොලිස් වසමට අයත් මාදම්පේ ප්‍රදේශයේ ලැගුම්හලක් තුළ දී පසුගිය ද (04) අබිරහස් ලෙස මියගිය තරුණියගේ දේහය පිළිබඳ අවසන් කටයුතු ඊයේ (06) දින සවස රක්වාන පුංචි බාරවත්තේ දී සිදුවූ අතර එහිදී පොලිසිය හා ජනතාව අතර උණුසුම්කාරී තත්ත්වයක් ඇතිවිය.

මෙසේ මියගොස් ඇත්තේ ක්‍රිෂ්නන් ප්‍රදීපා නැමති විසිදෙහැවිරිදි අවිවාහක තරුණියකි.

අවසන් කටයුතු සඳහා රැගෙන ආ දේහය රක්වාන දෙනියාය ප්‍රධාන මාර්ගයේ තබා මරණය පිළිබඳව සාධාරණ පරීක්ෂණයක් ඉල්ලා මාර්ගය හරස් කර ගම්වාසීන් හා පවුලේ අය විරෝධතාවයක් සිදු කළහ. පවුලේ ඥාතීන් කිහිප දෙනෙකු මෙම විරෝධතාවයට අකමැත්තක් දැක්වීය.

තරුණිය සමඟ ලැගුම්හලට ගිය තරුණයා පොලීසිය විසින් නිදහස් කිරීම පිළිබඳව උද්ඝෝෂණයේ යෙදුණු පිරිස දැඩි විරෝධයක් දැක්වීය.මේ අතර මාර්ගයේ ගමන් ගත් කිහිප දෙනෙකු සමඟම ගැටුම් ඇති කර ගත්හ.

## දිනපොත

### කටුදොර සුමන හිමියෝ අද දින පදවි ලබති

ගුලවිට කටුදෙර ගලපිටගල පුරාණ විහාරය, මාලිගාවත්ත ශ්‍රී නිවාසාරාම බෞද්ධ මධ්‍යස්ථානය යන උභය විහාරාධිපති ශ්‍රී සද්ධර්ම වාගීශ්වර සාහිත්‍ය විශාරද රාජකීය පණ්ඩිත ශාස්ත්‍රවේදී පූජ්‍ය කටුදෙර සුමන හිමියෝ කළුතර දිස්ත්‍රික්කයේ හා බෙන්තර වලල්ලාවිට කෝරළේ ද්විතීය සංඝනායක පදවියට පත්වෙති.

ඒ පිළිබඳ ශ්‍රී සන්නස්පත්‍රය ප්‍රදනය කිරීමේ පුණ්‍ය මහෝත්සවය අද (07 වැනිද) ශ්‍යාමෝපාලි වංශික මහා නිකායේ මල්වතු පාර්ශ්වයේ මහානායක අති පූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සුමංගලාභිධාන මහානායක ස්වාමීන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් මල්වතු මහා විහාරයේදී සිදු කෙරේ.

ධර්ම කීර්ති ශ්‍රී සිරිනිවාස ගෞරව නාමය සහිතව කළුතර දිස්ත්‍රික්කයේ හා බෙන්තර වලල්ලාවිට කෝරළයේ ද්විතීය සංඝනායක පදවියට පත් පූජ්‍ය කටුදෙර හිමියන් පිළිගැනීමේ පුණ්‍ය මහෝත්සවය ජූලි මස 09 වන ඉරුදින පස්වරු 3.00 ට ගුලවිට කටුදෙර ගලපිටගල පුරාණ විහාරස්ථානයේදී පැවැත්වේ.

මෙම අවස්ථාවට මල්වතු විහාර පාර්ශ්වයේ අනුනායක පූජ්‍ය නියංගොඩ විජිතසිරි නාහිමියන් ප්‍රමුඛ මහා සංඝරත්නය ඇතුළු ගිහි පැවිදි විශාල පිරිසක් සහභාගි වීමට නියමිතය.

### වෙන්නප්පුව ශාන්ත ජෝශප් වාස් ආදි සිසුවෝ හෙට යළි පාසලට

වෙන්නප්පුව ශාන්ත ජෝශප් වාස් විද්‍යාලීය ආදි ශිෂ්‍ය සංගමය ප්‍රථම වරට සංවිධානය කරන "නැවතත් පාසල කරා - Back to School" වැඩසටහන හෙට(8 වැනිද) දවස පුරා පැවැත්වීමට සියලු කටයුතු සූදනම් කර ඇතැයි ආදි ශිෂ්‍ය සංගමයේ විධායක සභාපති සුරාජ් කතුරුසිංහ පැවසීය.

මේ වෙනුවෙන් විවිධ වැඩසටහන් රැසක් විද්‍යාලයේදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති අතර ශ්‍රීමත් ඇල්බට් එෆ් ක්‍රීඩාංගනයේදී පැවැත්වීමට සුහද හමුවක්ද පැවැත්වේ. ශාන්ත ජෝශප් වාස් විද්‍යාලයේ ආදි ශිෂ්‍යන් සියලු දෙනාට මේ වෙනුවෙන් සහභාගී වන ලෙස ආදි ශිෂ්‍ය සංගමය ආරාධනා කරයි.

## දූ දරුවන්ට දැනුම බෙදූ විද්‍යා මාමා අද සමු ගනී

දර්ශාන් කානිල් - මොරටුව



විද්‍යාව මාමා සංකල්පය හඳුන්වා දුන් ජෝශප් ඩැනිස්ටර් කුරේ ගුරු පියාණන් අභාවප්‍රාප්ත විය.

කලක පටන් අසනීපව කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨ රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටි ඔහු ඊයේ (6 වැනිද) මිය යනවිට 75 වැනි වියේ පසුවිය . මොරටුව ,මොරටුමුල්ල ද මැල්පාර ප්‍රදේශයේ පදිංචිව සිටි ඔහුගේ දේහය පිළිබඳ අවසන් කටයුතු අද (7වැනිද) මොරටුමුල්ල

මෙතොදිස්ත සභාවට අයත් සුසාන භූමියේදී සිදු කිරීමට නියමිතය .ගුරුවරයෙකු මෙන්ම විදුහල්පති වරයෙකුව සිටි ඔහු විද්‍යාව පිළිබඳව පොත්පත් නොතිබුණු අවධියක මිහිර පත්තරේ විද්‍යා මාමා ලෙස සරල බස් වහරෙන් විද්‍යා ලිපි ඉදිරිපත් කරමින් ජනප්‍රියත්වයට පත් විය.මිහිර , විවිධ ළමා පුවත් පත් සඳහා විද්‍යා ලිපි සම්පාදනය කළ ඒ මහතා ශ්‍රී ලංකා ගුවන්විදුලියටද විද්‍යා වැඩසටහන් රැසක් ඉදිරිපත් කර ඇත.

## "තායි රාජා"ගැන...

දළඳ මාලිගාවට තායි රජතුමා පූජාකළ "තායි රාජා" යළි එරටට ගෙන්වා ගන්නැයි මෙරට සිටින අන්‍යාගමික එන්ජිඕ කාන්තාවක් මුල්වී කරන ප්‍රචාරය නිසා මේ සියලු අවුල් ඇතිවී ඇතැයිද හිටපු දියවඩන නිලමේවරයා පවසයි.

මෙම එන්ජිඕ කල්ලි බෞද්ධ සංස්කෘතියට පහරගහන්න කරන කුමන්ත්‍රණයන්ට එරෙහිව පියවර ගැනීමට රජයේ අවධානයද යොමු විය යුතුව ඇතැයිද ඔහු කියයි.

"තායිලන්ත රජ පවුල මෙන්ම එරට වැසියා දළඳ මාලිගාවට දක්වන්නේ අසීමිත ගෞරවයක්. ඒ ගෞරවය නිසාම තමයි දැන් ඉන්න රජතුමාගේ පිය රජතුමා මගේ ඉල්ලීමට තායි රාජා දළඳ මාලිගාවට පූජා කළේ. ඒ වගේම දැන් සිටින මහා වජිරලොංකෝර්න් මහ රජු රජවීමට පෙර 1993 ජනවාරි 21 දළඳ මාලිගාවට ආවා. එතුමාගේ මුල් බිසව වූ ස්වන්සවාලි දේවිය හා දූ කුමරියන් 1989 දි දළඳ මාලිගාවට ආවා. ඒ නිසා ඒ රජ පවුල හා දළඳ මාලිගාව අතර ඇත්තේ කිට්ටු සම්බන්ධයක්."

"අපේ රටට සියම් දේශයෙන් උපසම්පදව ගෙනත් වසර 270ක් වෙනවා. ඊට පෙර පොළොන්නරු යුගයේදී ලංකාවෙන් තායිලන්තයට උපසම්පදව ගෙනගියා. මේ නිසා අප දෙරට අතර ඇත්තේ කිසිද බිඳිය නොහැකි සම්බන්ධයක්. මිතුරුකමක්.

නමුත් මෑතක සිට තායිලන්තයේ සිටින හා මෙරට ඇති සමහර එන්ජිඕ සංවිධාන අපේ මේ සබඳතාව බිඳහෙළන්න නොයෙක් උප්පරවැට්ටි යොදනවා. දෙරටම බෞද්ධ රටවල් නිසා ඔවුන් උත්සහ කරන්නේ බෞද්ධ සංස්කෘතියට පහර ගසන්නයි. මේ තත්ත්වය ගැන තායිලන්ත තානාපතිවරයාට අවබෝධවී තිබීම සතුටට කාරණයක්" යැයිද හිටපු දියවඩන නිලමේවරයා කීය.

## වන් ගෝල් ෆේස්...

මෙම ඝාතනයට අදළව 30 හැවිරිදි අවන්හලේ කළමනාකාරවරයා කොටුව පොලිසිය වෙත බාර වීමෙන් පසු අත්අඩංගුවට ගෙන ඇත. මෙලෙස ඝාතනය වී ඇත්තේ අජේ කුමාර් නැමති 27 හැවිරිදි තරුණයෙකි.


මොවුන් සේවය කළ අවන්හල මීට මාස කිහිපයකට ඉහතදී විවෘත කර ඇති අතර මේ සඳහා ඉන්දියානු සේවකයන් පිරිසක්ද මෙරටට ගෙන්වා ගෙන ඇත.

එහි කළමනාකරුද ඉන්දීය ජාතිකයකු වන අතර ඔහු ඇතුළු ඉන්දීය සේවකයන් නවාතැන් ගෙන ඇත්තේ කොම්පඤ්ඤවීදියේ පිහිටි මහල් නිවාස සංකීර්ණයක නිවසකය. සැකකාර කළමනාකාරවරයාත් ඝාතනයට ලක්වූ සේවකයාත් එක් කාමරයක සිට ඇති අතර පෙරේද රාත්‍රියේ දෙදෙනා අතර බහින්බස් වීමක් හටගෙන ඇත්තේ සේවකයා විසින් නවාතැන් ගත් කාමරය දොරගුළු දමා යාමේ සිද්ධියකටය. පසුව එය ගැටුමක් දක්වා දුරදිග ගොස් ඇති අතර කාමරයේ තිබූ පිහියකින් හෝටල් කළමනාකාරවරයා සේවකයාට ඇන ඇත.

පිහි ඇනුමෙන් බරපතළ තුවාල ලබා සිටි හෝටල් සේවකයා කොළඹ ජාතික රෝහල වෙත ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇති අතර කළමනාකාරවරයා කොටුව පොලිසිය වෙත බාර වීමෙන් පසු අත්අඩංගුවට ගෙන ඇත.

මීට පෙරාතුවද අවන්හලේදී දෙදෙනා අතර බහින්බස් වීම් සිදුව ඇතැයි ද මූලික විමර්ශන මගින් හෙළිවී ඇත.

අත්අඩංගුවට ගත් සැකකාර කළමනාකාරවරයා කොටුව මහෙස්ත්‍රාත් තිලිණ ගමගේ හමුවට ඉදිරිපත් කිරීමෙන් පසු ලබන 14 වැනිද තෙක් රක්ෂිත බන්ධනාගාර ගතකර ඇත.



# අපේ කම, අපේ රට, ඔබේ වගකීම



# මර්වින් සිල්වා යළි කරළියට

## ජූලි 08 සෙනසුරාදා සවස 3.30 ට කැලණියේදී

## මර්වින් සිල්වා කැලණියට සහ රටට කළ සේවාවන්

1. පෑලියගොඩ ගුවන් පාලම ඉදිකිරීම
2. කැලණිය රජමහා විහාරස්ථානයට පිවිසෙන තොරණ හංදියේ තොරණ ඉදිකිරීම
3. ටයර් සංස්ථා පාර ප්‍රතිසංස්කරණය කර කොංක්‍රීට් කිරීම
4. කිරිබත්ගොඩ මංසන්ධියේ ඔරලෝසු කණුවක් ඉදිකිරීම
5. කිරිබත්ගොඩ නගර මධ්‍යයේ බුදුපිළිමයක් ඉදිකර සසුනට පූජා කිරීම
6. කිරිබත්ගොඩ සති පොළ සඳහා මුදල් අනුමත කර නව සති පොළක් ඉදිකිරීම
7. කැලණිය වෙසක් කලාපයට නව ජීවයක් ලබාදෙමින් වෙසක් තොරණ ඉදිකිරීම යළි ඇරඹීම
8. පරණ නුවර පාර පුළුල් කිරීම
9. වරාගොඩ විහාරස්ථානය අසල මාර්ගය අවහිරවන සේ තිබූ පෞරානික ගොඩනැගිල්ල නීත්‍යනුකූලව කඩා ඉවත් කිරීම
10. සර් ඩී.බී. ජයතිලක මාවතේ තිබූ අනවසර තාප්ප 46ක් ඉවත් කර මාර්ගය පුළුල් කර කාපට් කිරීම
11. පෑලියගොඩ 4 කණුවේ සිට නාගහමුල දක්වා බියගම පාර පුළුල් කර කැලණිය විහාරස්ථානය දක්වා කාපට් කිරීම
12. වැඩ අවසන් නොකර තිබූ කැලණි පාලම අංගසම්පූර්ණ මංතීරු දෙකකින් යුතුව වැඩ අවසන් කර ජනතා අයිතියට පත් කිරීම
13. කැලණියේ ගව මස් විකිණීම සම්පූර්ණයෙන්ම නතර කිරීම
14. කැලණිය විහාරස්ථානයේ  කොතේ රත්‍රන් ආලේප කර පූජා කිරීම
15. කැලණිය විහාරස්ථානයේ අතුරු පාරවල් සියල්ල කාපට් කර රථ ගාලද කාපට් කිරීම
16. වරාගොඩ පාර කාපට් කිරීම
17. සුළු ගංවතුරටත් යටවන කැලණියේ ජලය බැස නොයන සියලුම ඇළ මාර්ග පවිත්‍ර කර ගංවතුර පාලනය කිරීම
18. පෑලියගොඩ නුගේ පාර පුළුල් කර කොන්ක්‍රීට් කිරීම
19. පෑලියගොඩ මත්ස්‍ය වෙළඳපොල නිර්මාණය කිරීම
20. කැලණිය ජනාධිපති විද්‍යාලයට අඩුපාඩුවක්ව පැවති ක්‍රිඩා පිටියක් ලබාදෙමින් "මර්වින් සිල්වා" ක්‍රීඩා පිටිය ලබාදීම
21. වතුරෙන් යටවන සෝමාවතිය මාර්ගය ප්‍රතිසංස්කරණය කර බැතිමතුන්ට ගමන් පහසුව ලබාදීම
22. මහනුවර ශ්‍රී දළදා මාලිගාවට අවහිර වන ලෙස විවෘත කර තිබූ ඉදිරිපිට මාර්ගය වසා දැමීම
23. අවුරුදු ගණනක් බිලි පූජා කළ කාලි කෝවිලේ සතුන් මැරීම නතර කිරීම
24. ශ්‍රී මහා බෝධියට අඩුවක්ව පැවති රථ ගාලක් ඉදිකිරීම හා පන්දහසකට පහසුකම් සැපයිය හැකි ශාලාවක් ඉදිකිරීම
25. ශ්‍රී මහා බෝධියට පැන් වැඩීම සඳහා ගැලුම් 250ක් ලබාගත හැකි ළිදක් සකස් කර පූජා කිරීම
26. කැලණිය, රුවන්වැලි සෑය, මිරිසවැටිය, ථූපාරාමය, ලංකාරාමය, සෝමාවතිය සහ මහියංගණය චෛත්‍යවල කොත්වහන්සේලාගේ රත්‍රන් ආලේප කර, චෛත්‍යයේ හුනු ආලේප කර පූජා කිරීම
27. අනුරාධපුර නගරයේ පාරවල් පිළිසකර කිරීම
28. මාතලේ නගරයේ මාර්ග පිළිසකර කිරීම

# කතුවැකිය

ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
අංක 91, විජේරාම මාවත, කොළඹ 7.
දුරකතන : 0115 200 900
ෆැක්ස් : 0112 673 451
ඊ මේල් : aruna.editor@liberty.lk
කර්තෘමණ්ඩලය : 0115978982, 0115978985 ෆැක්ස් : 0112 673451
දැන්වීම් : 0112 672601, 0112 672603 ෆැක්ස් : 0112 672648
බෙදහැරීම් : 0112 127204, 0112 127210 ෆැක්ස් : 0112 455134
වෙබ් : www.aruna.lk
Follows us on https://www.facebook.com/aruna.lk.official
Follow us on https://twitter.com/arunapuwath
Follow us on https://www.instagram.com/aruna.lk

## සැහැල්ලු දුම්රිය හැල්ලු කිරීමේ විපාක

ඉතාම අඩු පොලී ප්‍රතිශතයක් යටතේ ජපානයේ ජයිකා ආයතනයෙන් ලබාදෙන ආධාර අනුව මෙරට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය ආණ්ඩු පෙරළියෙන් පසු අත්හිටුවීය. එහෙත් හදිසියේ එම ව්‍යාපෘතිය යළි සක්‍රිය කිරීමට ජනාධිපතිවරයාගේ උපදෙස් පරිදි කැබිනට් මණ්ඩලය අනුමැතිය දුන් බව මාධ්‍ය මගින් හෙළි කර තිබේ. ජයිකා ආයතනය පෙර සඳහන් කළ පරිදි 1.0% ක ණය ප්‍රතිශතයක් යටතේ ඩොලර් මිලියන 1850 ක මුදලක් මෙම ව්‍යාපෘතිය සඳහා දීමට නියමිතව තිබිණි. ඒ සඳහා වුවමනා කරන ගිවිසුම් ආදියද රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් අත්සන් කළ බව රහසක් නොවේ. එසේම මෙම මුදල ගෙවීමට අවුරුදු 12 ක සහන කාලයක් සහිතව වසර හතළිහක කාලයක් ශ්‍රී ලංකාවට දීමට ජපානය එකඟතාව පළ කෙරිණ. මෙසේ හැම අතින්ම රටට වාසිසහගත වූ එම ව්‍යාපෘතිය ප්‍රවාහන ආචාරියකුගේ උපදෙස් පරිදි පසුගිය ආණ්ඩුව මගින් අහෝසි කෙරිණ. මෙම අහෝසි කිරීමට මෙකී ප්‍රවාහන විශේෂඥයා දක්වා තිබුණු තර්ක ඉතාම පදනම් විරහිත ඒවා බවද විශේෂඥයන් විසින් දක්වා තිබේ.

විෂය මූලික කරුණුවලට වඩා මෙම ව්‍යාපෘතිය අහෝසි කිරීම සඳහා බලපා තිබෙන්නේ මනෝමූලික අගතිගාමී කුහක සිතිවිලි බව දැන් පැහැදිලිය. ඒ මේ රටේ හැටිය. මේ රටේ දේශපාලනයේ හැටිය. බල දේශපාලන වුවමනාකම් වෙනුවෙන් රටට කල්ප රුක්ෂයක් ලැබුණත් එය මුලින්ම කපා දමන ජාතියේ මිනිසුන් මෙහි සිටිති. නිදහස ලැබීමෙන් පසු මෙරට ක්‍රියාත්මක වූ දේශපාලන ක්‍රියාවලිය දෙස බැලීමෙන් එය මොනවට පැහැදිලි වේ. මේ රට අගාධයෙන් අගාධයට ගමන් කළේ මෙකී අදූරදර්ශී පිළිවෙත නිසාය. සිරිමාවෝ බණ්ඩාරනායක ආණ්ඩුව මගින් ක්‍රියාත්මක කරන ලද දේශීය නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැගීමේ වැඩපිළිවෙළ ජේ.ආර්. ජයවර්ධන ආණ්ඩුව මගින් අහෝසි කෙරිණ. එහි ඉතාම අමිහිරි ප්‍රතිඵල ආර්ථික සහ මානව අර්බුදයක් හැටියට අපි භුක්ති විඳිමින් සිටිමු. මෙරට දේශපාලනඥයන්, විපක්ෂ දේශපාලනය හැටියට සලකනුයේ රටට හතුරුකම් කිරීමය. අප එසේ කියන්නේ තමන්ගේ දේශපාලන ජාවාරම්වලදී මේ සියලු දෙනා පක්ෂ විපක්ෂ භේදයක් නැතිව එකට සිටගන්නා හෙයිනි.

කෙසේ වුවද ලංකාවේ ආණ්ඩුව විසින් අහෝසි කරනු ලැබූ ආකාරයේ සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතියක් ජපානය විසින් බංග්ලාදේශයට දී තිබේ. දැන් එම ව්‍යාපෘතියේ වැඩ බොහෝ සෙයින් නිම වී මේ වසර අවසානය වන විට විවෘත කිරීමට නියමිත බව ද දැන ගන්නට ලැබේ. දෙරටේම රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් එකඟ වූ පරිදි මෙකී සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූයේ නම් 2024 වන විට එහි වැඩ කටයුතු අවසන් වීමට නියමිතව තිබිණි. එම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කළේ කොළඹ කොටුවේ සිට, මාලබේටත්, මාලබේ සිට කොටුවටත් මිනිත්තු 16 කින් ගමන් කළ හැකි වියදම් අඩු කාලය බෙහෙවින් ඉතිරි කර ගත හැකි සේවාවක් මහජනතාවට සැපයීමටය. එය ක්‍රියාත්මක වූයේ නම් ඉතාම කෙටි කාලයකින් කොළඹ කොටුවේ සිට සෙත්සිරිපායේ අමාත්‍යාංශ සහ අනෙකුත් රාජ්‍ය ආයතනවලට පැමිණීමට රජයේ සේවකයන්ට සහ මහජනතාවට අවස්ථාව තිබිණි. කොළඹ කොටුවේ සිට බස් රථ මගින් සෙත්සිරිපායට සතියේ දිනවල පමණක් නොව සතියේ අග දිනවලත් පැමිණීමට විනාඩි 40 කට අධික කාලයක් වැය වේ. එහෙත් කාලය පමණක් නොව කායිකව සහ මානසික දැඩි පීඩාවකට ලක් වීමට ද මහජනතාවට සිදුවේ. එය වළක්වා ගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරිණ. කාර්යබහුල වේලාවන්හි දී මිනිත්තු 4 කට වරක් ද, අනෙකුත් වේලාවන්හි දී මිනිත්තු 10 කට වරක්ද මෙම දුම්රිය, යෝජිත දුම්රිය ස්ථාන කරා ධාවනය වන ආකාරයට මෙම ව්‍යාපෘතිය සැලසුම් කර තිබූ බව විශේෂඥයෝ සඳහන් කරති.

එසේ වුවද එම ව්‍යාපෘතිය අහෝසි කිරීමෙන් පසු රටේ මහජනතාවට ඉතා විශිෂ්ට ප්‍රවාහන ව්‍යාපෘතියක් අහිමි වූවා පමණක් නොව ඉතා ශක්තිමත්ව තිබූ ජපාන ශ්‍රී ලංකා හොඳ හිතද පළුදු විය. ජපානය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඉතා මිත්‍රශීලීව කටයුතු කරන අර්බුදකාරී අවස්ථාවලදී බෙහෙවින් සහයෝගය දැක්වූ රටකි. ජපන් ආධාර යටතේ විශාල ව්‍යාපෘති රැසක් ඉතා සාර්ථකව මෙරට ක්‍රියාත්මක වී තිබේ. එම ව්‍යාපෘති සඳහා දුන් ණයවලට සාධාරණ අපට දරාගත හැකි පොලියක්ද අය කිරීම ජපානයේ ක්‍රමයයි. එහෙත් මේ කිසිවක් නොතකා සාධාරණ පදනමක් නොමැතිව සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය අහෝසි කිරීමෙන් එවක ශ්‍රී ලංකා ආණ්ඩුව කළේ ඉඹින්නට දීපු අත සපාකෑමය. දැන් අපට ඒ සපා කෑ අතේ වටිනාකම යළි සිහිපත් වී ඇති හැටියකි.

මෙම ව්‍යාපෘතිය යළි සක්‍රිය කිරීමට ආණ්ඩුව සූදානමින් සිටියද එසේ ඒකපාර්ශ්විකව නතර කළ ව්‍යාපෘතියක් යළි ක්‍රියාත්මක කිරීමට ජපානය එකඟ වේද යන ගැටලුව ද මෙහිලා ඉස්මතු වේ. කෙසේ වුවද රාජ්‍ය තාන්ත්‍රික සාකච්ඡා මගින් එම ව්‍යාපෘතිය යළි ලබා ගැනීමට අපට හැකි වුවහොත් එය මහජනතාවට විශාල සහනයක් වනවාට සැකයක් නැත.

---



**වත්මන් ආණ්ඩුව ගැන රටේ ජනතාවගේ ප්‍රසාදය සියයට 11කින් වැඩිවී ඇති බවට වෙරිටේ රිසර්ච් ආයතනය කළ සමීක්ෂණයකින් හෙළිවී ඇති බවට වූ පුවතක් ඊයේ අරුණ පුවත්පතේ පළ විය. එලෙස හෙළිවූයේ ආණ්ඩුවේ ජනප්‍රියභාවය අඩුවී ඇති බවට විපක්ෂය දිගින් දිගටම පවසන ඇති පසුබිමකය. ඉදින් ඒ ගැන අප සමගි ජන බලවේගයේ මහ ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී රංජිත් මද්දුමබණ්ඩාරගෙන් විමසුවෙමු.**

# තව දෙතුන් මාසෙකින් ආණ්ඩුවේ ණය ගැටේ මහජනතාවගේ බෙල්ලටම හිරවෙනවා

**දේශීය ණය ප්‍රශස්තකරණය පිළිබඳව විපක්ෂය බිල්ලෙක් මැව් බව ඇතැමුන් කියනව. ඇත්තමට සජබය කියූ තරම් භයානක බවක් ප්‍රශස්තකරණ වැඩපිළිවෙළේ නැහැ කියල රජය චෝදනා කරනවා නේද?**

ආණ්ඩුව මුලදී කීවේ දේශීය ණයත් ප්‍රතිව්‍යුහගත කරනවා කියලයි. පස්සෙ තමයි ඔය ප්‍රශස්තකරණය කරනවා කියල කියන්නෙ. වචන වෙනස් කළාට මේ අය කරන්න හදන්නෙ එකම දේ කියලයි අපි කියන්නෙ. ධනපති පන්තිය රැකෙන විදියට මෙරටේ අසරණ වැඩකරන ජනතාවගේ සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල බිල්ලට දීල තමයි ආණ්ඩුව ප්‍රශස්තකරණයට සූදානම් වෙන්නෙ. ආණ්ඩුවත් තවම දන්නෙ නෑ මේ වැඩපිළිවෙළ නිසා මේ අරමුදල්වලින් කොයි තරම් මුදලක් ක්ෂය වෙනවද කියල. දැනටමත් ඩොලර් එක නැගල බඩු මිල ඉහළ ගිහිල්ල තියෙන නිසා රුපියල ක්ෂය වෙලයි තිබෙන්නෙ. මහ බැංකුවේ භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත්වල මුදල් ආයෝජනය කරල තියෙන්නෙ මෙරටේ සල්ලි තිබෙන අයයි. ඒකට අත නොතියා සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල තමයි දේශීය ණය ප්‍රශස්තකරණයේදී බිල්ලට දීල තියෙන්නෙ. මේ නිසා මේ අරමුදල්වල සාමාජිකත්වය දරන ලක්ෂ විසිහයක තරම් ජනතාවට හානියක් සිද්ධ වෙනවා.

**ආණ්ඩුව මේ වන විටත් කියල තිබෙනවා පොලිය 9% සීමාවේ තබා ගනිමින් මේ අරමුදල්වල ප්‍රතිලාභීන්ට ඔවුන් ගේ අරමුදල් ඕනෑම වෙලාවක ලබා ගන්න අවස්ථාව සලසා තිබෙනවා කියල. එහෙම තිබියදී පාර්ලිමේන්තුවේ වගකිව යුතු විපක්ෂයක් විදියටබොරු චෝදනා ගොතලා ජනතාව නොමඟ යවන්නෙ ඇයි?**

අපි බොරු කියලා ජනතාව කුලප්පු කරන්නෙ නෑ. ආණ්ඩුව තමයි මේ හැම කාරණයකදීම ජනතාව ගෙන් සත්‍ය වසන් කරන්නෙ. ආණ්ඩුව කියන්නෙ එකක්, කරන්නෙ එකක්. අපි කියන්නෙ දේශීය ණය ප්‍රශස්තකරණයේදී අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදලේ කොපමණ මුදලක් ඒ අරමුදල්වලට අහිමි වෙනවද කියල රජය ගණන්බලා තිබෙනවාද කියල රටට කියන්න කියලයි. එහෙම ගණන් බලලා තිබෙනවා නම් ඒ මුදල කොපමණද කියලත් කියන්න ආණ්ඩුවට පුළුවන් වෙන්න ඕනේ.

දැනට සේවක භාරකාර අරමුදලේ රුපියල් ට්‍රිලියන 3.4ක් තිබෙනවා. මේ මුදල් යොද ගෙන තමයි රජය ගත්තු ණය ප්‍රශස්තකරණය කරන්න හදන්නෙ. මේ ගැන දැනටමත් ආර්ථික විශේෂඥයන් කරුණු අධ්‍යයනය කරගෙන යනවා.

**විපක්ෂය විදියට ඔබලා මොනවා කීවත් රජය කෙරෙහි ඇති ජනතා ප්‍රසාදය ඉකුත් පෙබරවාරියට වඩා 11%කින් ජුනි මාසය වන විට වැඩිවී ඇති බව සමීක්ෂණයකින් හෙළිව තිබෙනවා. ඒකෙන් අදහස් කරන්නෙ ඔබලා බොරු කියන බව ජනතාවට අවබෝධ වී ඇති බවක් නේද?**

ඔබ කියන විදියට පෙබරවාරි මාසයේදි රජය කෙරෙහි ප්‍රසාදය පල කර තිබෙන සංඛ්‍යාව ඔබ දන්නවාද?

**ඔව්, මේ සමීක්ෂණය අනුව පෙබරවාරියේ දී ආණ්ඩුව වැඩ කරන ආකාරය ගැන 10%ක් ප්‍රසාදය පල කර තියෙනවා....**

ඉතින් ඒකෙන්ම පැහැදිලියි තවමත් මේ ආණ්ඩුව කරන වැඩ ගැන රටේ ජනතාවගෙන් හතරෙන් එකක්වත් කැමැත්ත පල කරලා නෑ කියල. ඔබ දන්නවා මෙරටේ ජනතාවගෙන් හැටනව ලක්ෂයක් ඡන්දිය දීල පත් කර ගත්තු ආණ්ඩුවට මේ වන විට රටේ මුළු ජනගහනයෙන් 25% ක්වත් කැමති නෑ. මේවන විට මේ රටේ දරුවන්ගෙන් 60% කට වැඩිය මන්ද පෝෂණයෙන් පෙළෙනවා. රෝහල්වල බෙහෙත් නෑ. බාල බෙහෙත් බීල මිනිස්සු මැරෙනවා. මේ වෙනකොට රටේ තිබුණ බොහෝ කර්මාන්ත වැහිලා රැකියා ලක්ෂ විස්සක් විතර නැතිවෙලා තිබෙනවා. දැන් මේ ප්‍රශස්තකරණය නිසා වැඩ කරන ජනතා මුදල්වලට වෙන්නෙ මොකද කියල දැන ගත්තාම ඔය වැඩිවෙලා තියෙන ප්‍රසාදය දෙගුණයකින් පහළ යන්නත් පුළුවන්.

**ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුව වැඩ කරපු ආකාරයට විරෝධය පල කරලා තමයි අරගලය ඇති වුණේ. දැන් මේ ආණ්ඩුවට එරෙහි අරගල කරන්නෙ නෑ. දැන් මාසයෙන් මාසයට ආණ්ඩුවේ වැඩ කරන ආකාරය ගැන ජනතා ප්‍රසාදය වැඩි වෙනවා. ඔබලාට එය ඉවසා ගන්න බැරිවෙයි නේද?**

මම මුලදිම කිව්වෙත් එද හැටනව ලක්ෂයක් ජනතාව ඡන්දය දීල පත් කර ගත් ආණ්ඩුවට ජනතා කැමැත්ත නැතිව ජනාධිපතිට ගෙදර යන්න වුණා. ඔබ කියන විදියට දැන් මේ ආණ්ඩුව වැඩ කරන ආකාරයට ජනතා කැමත්ත මාසයෙන් මාසයට වැඩි වෙනවා. එහෙම වෙනවද කියල අපි බලාගෙන ඉඳිමු. තෙල් පෝලිම් ගෑස් පෝලිම් නැති වුණාට ජනතාවට ජීවත් වෙන්න බැරි තැනට මේ රට පත් කරලා තියෙන්නෙ. ණය ප්‍රතිව්‍යුහගත කරලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දෙවන ණය වාරිකයත් අරගත්තාට පස්සෙ රට කොහොමද කටයුතු කරන්නෙ කියල බලා ගෙන ඉමු. එදාට ජනතාවට දැනෙන පීඩනයට මේ ආණ්ඩුවට මුහුණ දෙන්න බැරි වෙයි.

**අස්වැසුම වැඩපිළිවෙළ අසාර්ථක බව ඔබලා කියනවා. ඔබලත් සමෘද්ධි ව්‍යාපාරය දේශපාලනීකරණය කළා. එහෙම නම් දැන් ආණ්ඩුව මේ කරන්න හදන දේ අසාර්ථකයි කියන්නෙ කොහොමද?**

සමෘද්ධිය දේශපාලනීකරණය කළේ අපි නොවෙයි. දුප්පත් මිනිස්සු සමෘද්ධියට ගැටගහල දේශපාලන හිරකරුවෝ කරලා ඡන්ද ව්‍යාපාරයේ කටයුතු කළේ අපි නොවෙයි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණයි. අපි කළේ දේශපාලනීකරණය වෙලා තිබුණ සමෘද්ධි ව්‍යාපාරය සැබෑ නැතිබැරි අයගේ ව්‍යාපාරයක් බවට පත් කරලා අසාධාරණයට ලක්ව සිටි අයට සහන දුන්න එක විතරයි. දැන් තියෙන්නෙ එහෙම ප්‍රශ්නයක් නොවෙයි. රටෙන් බාගයකට කන්න නෑ. ඒ නිසා ලෝක බැංකුව සමීක්ෂණයක් කරලා ඒ නැති බැරි පවුල්වලට සහන සලන්න කියල තමයි ඩොලර් මිලියන 200ක් දුන්නෙ. ඒකවත් හරියට බෙද ගන්න බැරි ආණ්ඩුවක් කියල දැන් ලෝකයම දන්නවා. ආණ්ඩුවේම අයත් කියනවා මේ තේරීම වැරදියි කියල. ඒ වැරැද්ද නිවැරදි කරන්න කියල දැන් රටම එළියට බැහැල උද්ඝෝෂණය කරනවා. අපි කියන්නෙ මේ ආධාර ලැබිය යුතු පවුල් නිවැරදිව තෝරා ගෙන මේ ආධාර දෙන්න කියලයි.

**ඔබ පක්ෂයේ සමහරු ආණ්ඩුව කරන දේ හරි කියනවා. ඔබලා ඒවා වැරදියි කියනවා. ඔබේ පක්ෂය ඇතුළෙවත් සාමූහික එකඟතාවක් නැතුව කොහොමද රට බාර අරගෙන කරගෙන යන්නෙ?**

මාධ්‍ය කරවන ඔබලාත් ලොකු උත්සාහයක් ගන්නවා අපේ පක්ෂය ඇතුළෙ අර්බුදයක් තිබෙනවා කියල පෙන්වන්න. පසුගිය කාලය පුරාවටම කීවා සජබයේ මන්ත්‍රීවරු පිරිසක් ආණ්ඩුවට යනවා කියල. ආණ්ඩුවත් ඒ ගැන පුන පුනා කීවා. නමුත් තාම එහෙම දෙයක් වුණේ නෑ. මුලදී මන්ත්‍රීවරු තුන්දෙනෙක් ගියාට ඉන් පස්සෙ තවම එක්කෙනෙක් වත් ගියේ නෑ. නමුත් ආණ්ඩුවෙන් අපේ විපක්ෂයට මන්ත්‍රීවරු තිස් ගණනක් ඇවිත් ඉන්නවා. ඒවා ගැන කවුරුත් කතා කරන්නෙ නෑ.

**ජනාධිපතිවරයා මෑතක සජිත් ප්‍රේමදාස ඔබේ නායකයට කියල තිබුණා විපක්ෂ නායකකමත් රැකල දීල ජනාධිපති වෙන්නත් මග පෙන්වන්නම් කියල. ඒක සජබයේ බල්ලා මල්ලෙන් එළියට පැනීමක්ද?**

ජනාධිපති රනිල් වික්‍රමසිංහ කියන සමහර දේවල් අපි විශ්වාස කරන්නෙ කොහොමද කියලා තමයි අපි හිතන්නෙ. මොකද එතුමට එතුමගේ විපක්ෂනායකකමවත් රැක ගන්න බැරි විදියට පක්ෂය ජාතික ලැයිස්තු මන්ත්‍රී ධූරයකට පමණක් සීමාකරන්න ජනතාව තීන්දු කර තිබියදී එතුමා කොහොමද සජිත් ප්‍රේමදස මහතාගේ විපක්ෂ නායකකම රැකල දෙනවා කියන්නෙ. සජිත් ප්‍රේමදස මහත්තයා මෙරටේ ජනාධිපතිවරයා කරන්න රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා සහය දෙනවා නම් අපි ඒ ගැන සතුටු වෙනවා. එතුමා එහෙම කියන්නෙ ඊළඟ ජනාධිපතිවරණයට ඔහු ඉදිරිපත් වෙන්නෙ නෑ කියන එකද? ඒක එහෙම නම් ඒ ගැන ඉස්සෙල්ලා රටට කියන්න කියලයි අපි ඉල්ලන්නෙ.

**මැතිවරණයකින් පස්සේ නැවත නැවත ජනමතය වෙනස් වෙන බව ඔබත් දන්නවා. දැන් එජාප පෙරට වඩා ජනතා ප්‍රසාදයට ලක්වෙලා. ඒක පිළිගන්න තරම්වත් ඔබලා අවංක නෑ කියල සමහරු කියනවා?**

නෑ. ඒ අය කියන දේ ඇත්ත නම් ඒක අපි පිළිගන්න සූදානම්. නමුත් ඔය කියන දේ බොරු. රනිල් වික්‍රමසිංහ මහතා පසුගිය වසර විස්සක විතර කාලයේ ජනතා අගැයීමට ලක් වුණේ කොහොමද කියල රටම දන්නවා. අපි කියන්නෙ මැතිවරණයක් තියල බලන්න කියල. එතකොට තේරුම් ගන්න පුළුවන් ජනමතය තිබෙන්නෙ කොතැනද කියල.


**ඔබලා අධිතක්සේරුවක ඉන්නවා මීළඟ මැතිවරණය ඔබලාට ජය ගන්න පුළුවන් කියලා?**

නෑ. අපි කියන්නේ රටපුරා ජනතා ප්‍රතිචාර අනුවයි. මීළඟට මෙරටේ කුමන මැතිවරණයක් තිබ්බත් එයින් ජය ගන්නෙ සජබය කියල මේ වන විටත් රටේ බහුතර ජනතාව තීරණය කරලා ඉවරයි. රනිල් වික්‍රමසිංහ මහතාට ගියවර ගත්තු ඡන්ද ටිකවත් මෙවර ලැබෙන්නෙ නෑ. මොකද ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ හොර තක්කඩීන් පිරිසක් වට කර ගෙන ජනාධිපතිවරයා කටයුතු කරන බව දැන් රටම දන්නවා. අහම්බෙන් ලැබුණ ජනාධිපති ජනතාව පිළිගන්නවා කියල කවුද කියන්නෙ?

**ඔබ කිව්වට අහම්බෙන් ලැබුණ ජනාධිපති ධූරයක් කියල, මේ වන විටත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හා එජාපය රනිල් වික්‍රමසිංහ නැවත ජනපති කරන්න කටයුතු කරමින් ඉන්නවා කියලත් කියනවා නේද?**

ඕනෑම දේශපාලන පක්ෂයක නොවෙනස් වෙන සාමාජික සංඛ්‍යාවක් ඉන්නවා. නමුත් බහුතර ජනතාව විටින් විට දේශපාලනිකව වෙනත් මතවාද එක්ක එකතු වෙනවා. මේ වන විට අපිට සහය දෙන බහුතරයක් එජාපයේ හිටපු අයයි. ඒ වගේම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සාමාජිකයනුත් දැන් අපිත් එක්ක ගම් මට්ටමේදී එකතු වී ඉන්නවා. ජනතා විමුක්ති පෙරමුණේ අයත් අපි එක්ක එකතුව ඉන්නවා. ඒ නිසයි මම කියන්නේ මීළඟට තියෙන ඕනෑම මැතිවරණයක් අපි දිනනවා කියල. නැවතත් මම කියන්නෙ මැතිවරණයක් තියන්න කියලයි. එතකොට ඇත්ත මොකක්ද කියල බලා ගන්න පුළුවන්.

■ සංවාදය - ජයසූරිය උඩුකුඹුර




## ගපිරීගේ කවිය

### කලකින් ෆොන්සේකා

“අපි එක්කල එද අගමැති ලෙස හිටිය
චරිතෙම අදත් මෙතනදී රඟනා හැටි ය
කල් මර මරා ජොලියේ ඉන්නා එක ය
රටට ම ඉතිං අබ සරණයි නෑ සැක ය“

ෆොන්සේකගේ අදහස බැලුව ම සැර ය
පොලිස්පති ගැනත් දුන් පිළිතුරු මරු ය
"දේශබන්දු ආවොත් හොද්දත් බොර ය"
රටකට වෙන්න යන දේ හිතුව ම කොර ය



# ගල් කඩන හයිය ගන්න තල් ඇටෙන් කෑම හදයි

■ නිර්මාණී තිලකසිරි

තල් පරේයේෂණ ආයතනය විසින් තල් ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන සැකසීම පිළිබඳව සිදුකරන පරේයේෂණවල ප්‍රතිඵලයක් ලෙස තල් පිටි යොදා ගනිමින් නමින් ශක්තිජනක ආහාරයක් නිෂ්පාදනය කර තිබේ.

තල් ඇටවලින් ලබා ගන්නා පිටි යොදා ගනිමින් මෙම නිෂ්පාදනය සිදුකරන අතර කෙටි වේලාවකින් සකසාගත හැකි මෙම ආහාරය වැඩිහිටියන්ට මෙන්ම කුඩා දරුවන්ට ද ඉතාමත් ගුණදායකය. තල් පිටි සතුව වැඩි තන්තු ප්‍රමාණයක් ඇති බැවින් එය ආහාර ජීර්ණයට පහසු කරවන අතර, කාබෝහයිඩ්‍රේට් සපිරි ශක්තිජනක ආහාරයක් ලෙසද මෙය හැඳින්විය හැකි බව තල් පරේයේෂණ ආයතනය සඳහන් කරයි.

තල් යනු කිසිදු රසායනික පොහොරක් නොමැතිව ස්වාභාවිකව වැඩෙන ශාකයකි. මෙම නිෂ්පාදනය පරිභෝජනයෙන් කිසිදු අතුරු ආබාධයක් ඇති නොවන බවත්, එබැවින් වෙළෙඳපොළේ පවතින අනෙකුත් නිෂ්පාදන සමග පහසුවෙන් තරග කිරීමේ හැකියාව 'ෆ්ලාම් පෝෂා' සතු බවත් එම ආයතනය පවසයි.

මේ වන විටත් අපනයන වෙළෙඳපොළ ඉලක්ක කරගනිමින් තල් පෝෂ නිෂ්පාදන කටයුතු සිදු කෙරෙන අතර, මෙම නිෂ්පාදනය සිදුකිරීමට කැමැත්තක් දක්වන අයට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීමට ද සූදානම් බව තල් පරේයේෂණ ආයතනය හා තල් සංවර්ධන මණ්ඩලය සඳහන් කරයි.

# ඇසේ ශල්‍ය කර්මයෙන් පසු කත මියගියේ හෘදයාබාධයකින්

## - මරණ පරීක්ෂණයෙන් තහවුරු වෙයි



මියගිය කත

■ වරුණි පෙරමුණ
■ ආර්.එස්. ධම්දාස - බලපිටිය
■ ඒ.ඒ. චම්පිකා - ඇල්පිටිය

කොළඹ ජාතික අක්ෂි රෝහලේ දී ඇසේ ශල්‍ය කර්මයක් සිදු කිරීමෙන් පසු මියගිය තිස්පස් හැවිරිදි දෙදරු මවගේ මරණයට හේතුව හෘදයාබාධයක් බව කොළඹ නාගරික අතිරේක හදිසි මරණ පරීක්ෂක ඉරේෂා සමරවීර විසින් තහවුරු කර ඇත.

ඊයේ (6 වැනිදා) මෙම කාන්තාවගේ මරණ පරීක්ෂණය සිදු කළ අතර, එමගින් තහවුරු වී ඇත්තේ ඇගේ හෘදයෙහි අධික ලෙස මේදය තැන්පත් වී තිබූ බවත් ඒ අනුව හදිසි හෘදයාබාධයක් වැලඳී ඇති බවත්ය.

මියගිය කත මීට පෙර කොළඹ ජාතික අක්ෂි රෝහලෙන් ඇසට කාචයක් දමාගෙන ඇති අතර, පසුව ඇතිවූ අසාත්මිකතාවක් හේතුවෙන් යළි එම ඇසේ ශල්‍ය කර්මයක් කිරීමට එදිනම රෝහලට ඇතුළත් වී තිබේ.

ඒ අනුව පෙරේදා (5 වැනිදා) ඇය අදාළ ශල්‍යකර්මයකට භාජනය කර ඇත. එම ශල්‍ය කර්මය සිදු කිරීමට පෙර ඇයට නිර්වින්දන ඖෂධක් ලබා දී ඇති අතර, ශල්‍ය කර්මයෙන් පසු ඇය සිහිය නොලබා හෘදයාබාදයක් වැලඳී මෙසේ මිය ගොස් තිබේ.

මේදය තැන්පත්වී හෘද නාළ අවහිරවූ අයකුට යම් නිර්වින්දන ඖෂධයක් ලබා දුන් පසු ශරීරයේ සිදුවන වෙනස්කම් සමග මෙසේ හෘදයාබාධ වැලඳීමේ සම්භාවිතාවක් ඇති විය හැකි බවද වෛද්‍යවරු පෙන්වා දෙති.

මෙලෙස මියගොස් ඇත්තේ කොස්ගොඩ, බොරලුකැටිය දකුණ, පදිංචිව සිටි එච්.ජී. හිමාලි ප්‍රියදර්ශනී වීරසිංහ නමැති දෙදරු මවකි.

මේ අතර, ශල්‍ය කර්මය සිදු කිරීමෙන් පසු ඇය සිහි නොලබාම මරණයට පත්වීම ගැටලු සහගත බවත් ශල්‍ය කර්මය කිරීමට ඇයට ලබාදුන් නිර්වින්දන ඖෂධය විස වීම නිසා මෙම මරණය වන්නට ඇති බවටත් පවුලේ ඥාතීහු චෝදනා කරති.

### සෞඛ්‍ය වෘත්තීය සමිති අපක්ෂපාති පරීක්ෂණයක් ඉල්ලයි

සෞඛ්‍ය වෘත්තීයවේදීන්ගේ විද්වත් සංගමයේ සභාපති රවී කුමුදේශ් සහ වෛද්‍ය හා සිවිල් අයිතිවාසිකම් පිළිබඳ වෛද්‍යවරුන්ගේ වෘත්තීය සමිති සන්ධානයේ සභාපති විශේෂඥ වෛද්‍ය චමල් සංජීව මෙම මරණය සම්බන්ධයෙන් අපක්ෂපාති පරීක්ෂණයක් පවත්වන ලෙස සෞඛ්‍ය ලේකම්වරයාගෙන් ඉල්ලා සිටිති.

එසේ පරීක්ෂණයක් පවත්වා මෙම මරණය සිදුව ඇත්තේ නිර්වින්දන ඖෂධයේ ප්‍රතිඵලයක්ද, ශල්‍යකර්මයේ අතුරු ප්‍රතිඵලයක් ද, වෙනත් කායික රෝගී තත්ත්වයක් ද නැතහොත් වෙනත් ඖෂධයක සංකූලතාවයක් නිසා ඇතිවූ තත්ත්වයක් දැයි නිසි පරිදි වොහාරික හා විශ්ලේෂණ වාර්තාවක් මගින් ප්‍රකාශ කරන ලෙස ඔවුහු සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් වැඩිදුරටත් ඉල්ලීමක් කරති.

# ග්‍රහචාරය

2023 ජූලි 07 වැනිදා
සිකුරාදා

රාහු කාලය
උදේ 10.41 - මධ්‍යහ්න 12.16
රාත්‍රි 10.49 - මැදියම 12.16

සුබ දිශාව - බස්නාහිර
මරු - ගිනිකොණ

### මේෂ
**ප්‍රවේශමෙන්**

පොදු කටයුතුවලදී ඍජු හා අන්‍යයන්ට හිතෛෂී ලෙසින් කටයුතු කළද අන්‍යයන්ගෙන් ලැබීම් කටයුතු සම්බන්ධව පීඩාවන් ඇතිකළ හැකි බැවින් වඩාත් ප්‍රවේශමෙන් කටයුතු කරන්න. තමාගේ අවබෝධය මතම කටයුතු මෙහෙයවන්න.

### වෘෂභ
**මිශ්‍ර ඵලදයි**

හොඳ හා නරක මිශ්‍රව ඵලදෙන දිනයකි. මානසික තත්ත්වයකින් යුතුව වැඩ කිරීමට ඉඩ ඇතද එය වැළකීමට හේතු රැකියාව සම්බන්ධව ඇතිවේ. හැකි තරම් දුරට කතාබහ ඉවසීමෙන් යුතුව පාලනය කරගන්න.

### මිථුන
**කල්පනාකාරී වන්න**

තම විශ්වාසය හා හැකියාව අනුව වැඩ කටයුතු මෙහෙයවීමට ඉඩ ලැබෙනු ඇත. පොත්පත් ලිපිලේඛන හෝ ප්‍රකාශන සම්බන්ධව විශේෂයි. උරුමගත දේ සම්බන්ධව ගැටලු ගැන කල්පනාකාරී වන්න.

### කටක
**ගමන් බිමන් අධිකය**

බොහෝ දුරට කරදරකාරී හිරිහැරදායක දිනයක් විය හැක. විවාහයන් සම්බන්ධව තීරණ බොහෝ දුරට කරදර වේ. වෙළෙඳ ව්‍යාපාර කටයුතුවලට සාමාන්‍යයෙන් යහපත් වුවද ගමන් බිමන් අධික විය හැකිය.

### සිංහ
**අර්බුදකාරී**

ගැටලු, බාධක ඇතත් ඊට ශක්තිමත්ව මුහුණ දීමට ඉඩකඩ ලැබෙන මුත් වඩාත් ආරක්ෂාකාරී වීම සුබයි. අන්‍යයන් හා එකඟතාවන් ගැන වැඩි අර්බුදකාරී තත්ත්වයන් ඇතිකළ හැක. ඉක්මන්කම පාලනය කරගන්න.

### කන්‍යා
**අයිතීන් ගැන ගැටලු**

ශාස්ත්‍රීය කටයුතුවල යෙදෙන අයට කාර්යබහුල වුවත් සුබදායක බවක් පෙනේ. ශරීර සෞඛ්‍යය ගැන වැඩි උනන්දුවක් අවශ්‍යයි. මිල මුදල් ගනුදෙනු පිළිබඳව වඩාත් සැලකිලිමත් වන්න. අයිතීන් ගැනද ගැටලු පෙන්නුම් කරයි.

### තුලා
**දුරබැහැරින් වාසි**

සාමාන්‍යයෙන් පවතින මෘදු ස්වභාවයන්හි තරමක වෙනස්කම් ඇතිවේ. ලැබීම්වලට යහපත් වුවත් වේගවත් හැසිරීම් රටාව පාලනය කරගන්න. දුරබැහැර වාසි පෙන්නුම් කෙරේ.

### වෘශ්චික
**අන්‍යෝන්‍ය සබඳතා**

රැකියාව සම්බන්ධව වඩාත් කාර්යබහුල වීමක් ඇතිවේ. එහෙත් මානසික වශයෙන් ඉතාමත් අසීරු තත්ත්වයක් ඇති කරනු ඇත. නිවාස, දේපොළ පිළිබඳ ගැටලු වඩාත් තීව්‍ර කරනු ඇත. අන්‍යෝන්‍ය සබඳතා කරදරකාරී විය හැකිය.

### ධනු
**සහෝදර ගැටලු**

ඔබගේ සාමාන්‍ය පැවැත්ම තවදුරටත් යහපත් අයුරින් පැවතුණද මානසික වශයෙන් යම් යම් අසහනකාරී තත්ත්වයන් ඇතිකළ හැක. සහෝදර ගැටලු ගැන වඩාත් ඉවසීමෙන් කටයුතු කරන්න.

### මකර
**ශරීර උෂ්ණාධිකය**

එදිනෙද කටයුතු ගැන කතාබහ තවදුරටත් පාලනය කරගන්න. අර්බුදකාරී තත්ත්වයන්ට ඉඩ ඇතිකළ හැකි බැවිනි. ඒ නිසා යම් යම් අලාභයන්ට වුව ඉඩ ඇති කෙරේ. ශරීර උෂ්ණාධික බව පාලනය කරගන්න.

### කුම්භ
**කරදරකාරී දිනයකි**

විශේෂයෙන් ශරීර සෞඛ්‍යය ගැන කල්පනාකාරී වන්න. සෙම විකෘති වීම් වඩාත් සංකීර්ණ විය හැකිය. මිල මුදල් පරිහරණ දෝෂ ඇතිවේ. වියදම් පාලනය කරගන්න. විවාහ යෝජනා කෙරෙහි අහිතකර බලපෑම් ඇතිවීමට පුළුවන. කරදරකාරී දිනයකි.

### මීන
**පපුවේ අමාරු**

දරුවන් සම්බන්ධ කරදර තත්ත්වයන් ගැන වඩාත් විමසිලිමත් වන්න. වත්කම්, තැන්පතු පිළිබඳ විරෝධතා ඇතිවීමට පුළුවන. පපුවේ අමාරු ගැන විශේෂ අවධානයක් අවශ්‍යයි. සහෝදරයන් හා ගැටුම්කාරී අවස්ථා පාලනය කරගන්න.

# අරක්කු පොවා එළිවෙනතුරු සිසුවකු අපයෝජනය කළැයි දෙයියා රිමාන්ඩ්

■ උපාලි ආනන්ද කරුණාදාස - අනුරාධපුර

15 හැවිරිදි පාසල් සිසුවකු රවටා ගෙන පදවිය ජලාශය ආසන්නයේ ගල් වළකට රැගෙන ගොස් බලහත්කාරයෙන් මත්පැන් පොවා, සිහිසුන් වනතුරු රාත්‍රිය පුරාම වරින් වර බරපතළ ලෙස අපයෝජනය කිරීමේ සිද්ධියට සම්බන්ධ සැකකරුවන් දෙදෙනකු මෙමස 12 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙස කැබිතිගොල්ලෑව දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත් කසුන් කාංචන දසනායක නියෝග කළේය.

සැකකරුවන් විසින් අපයෝජනය කළ බව කියන පාසල් සිසුවා සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍ය වාර්තාව අධිකරණය හමුවට ඉදිරිපත් කරන ලෙසද මහෙස්ත්‍රාත්වරයා පදවිය පොලිසියට තවදුරටත් නියෝග කළේය.

මෙසේ රිමාන්ඩ් කළේ අනුරාධපුර මාතලේ හංදිය, සමගි මාවත පදිංචි ඩබ්ලිව්. කේ.ජ්. රවීන්ද්‍ර හෙවත් 'දෙයියා' සහ පදවිය ඉහළ බිසෝ කොටුව පදිංචි එස්.ජ්. රසික බණ්ඩාර යන අයයි.

පළමු සැකකාර රවීන්ද්‍ර නමැත්තාට එල්ල වී ඇති චෝදනාව වන්නේ 15 හැවිරිදි පාසල් සිසුවකුට මත්පැන් පොවා සිහිසුන් වනතුරු එම සිසුවා වරින් වර බරපතළ ලෙස අපයෝජනය කිරීමයි. දෙවැනි සැකකාර රසික බණ්ඩාරට ඇති චෝදනාව වන්නේ මෙම අපරාධය සඳහා ආධාර අනුබල ලබා දීමයි.

මේ අතර, පළමු සැකකරුද මත්පැන් කරමින් මෙම අපරාධය සිදු කර ඇති බව මූලික පොලිස් විමර්ශනවලදී අනාවරණය වී තිබේ.

අතවරයට පත් දරුවාගේ මව පදවිය පොලිසියට කරන ලද පැමිණිල්ලකට අනුව මූලික විමර්ශන මෙහෙයවා සැකකරුවන් අත්අඩංගුවට ගෙන තිබිණි.

දරුවාගේ මව මේ සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කරමින් ප්‍රකාශ කර ඇත්තේ, සවස් කාලයේ නිවසෙන් පිටව ගිය තම දරුවා පසුද පහන් වන තුරු නිවසට නොපැමිණීම බැවින තමන් ඒ ගැන පවුලේ උදවිය සමග සොයා බැලීමේදී දරුවා සිහිසුන්ව ගල් වළක සිටින බවට තමන්ට තොරතුරක් ලැබුණු බවයි.

පදවිය පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක විජය කුමාරසිරිගේ උපදෙස් මත අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක සම්පත් සෙනවිරත්නගේ මෙහෙයවීම මත සැරයන්වරුන් වන රණසිංහ මිණිපුර සහ අශෝක ධර්මදාස සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කරමින් කරුණු සඳහන් කළහ.

සැකකරුවන් වෙනුවෙන් නීතිඥ තුෂාරි සේනානායක පෙනී සිටියාය.

# සංචාරක වීසා වලින් කාන්තාවන් රට යැවූ කතුන් දෙදෙනකු දැලේ

■ ජූඩ් සමන්ත - පුත්තලම

ඕමානයේ රැකියාවක් සඳහා සංචාරක වීසා යොදගෙන කාන්තාවක විදෙස් ගත කිරීමට උත්සාහ කළ තැනැත්තියක විදේශ සේවා නියුක්ති කාර්යංශයේ නිලධාරින් විසින් කටුනායක ගුවන් තොටුපළේදී අත්අඩංගුවට ගෙන ඇත.

එලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ කොළඹ 02, ගැලනි ප්‍රදේශයේ පදිංචි කාන්තාවකය. ඇය විසින් විදේශ ගත කිරීමට උත්සාහ කර ඇත්තේ කොක්කඩිචෝලේ පදිංචි කාන්තාවකි.

මීගමුව මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් පසු සැකකාර කාන්තාව රුපියල් ලක්ෂ පහක ශරීර ඇප මත මුදා හැර තිබේ.

මේ අතර, කෑගල්ල ප්‍රදේශයේ පිහිටි ව්‍යාජ විදේශ රැකියා නියෝජිත ආයතනයක කාන්තාවක ද විදේශ සේවා නියුක්ති කාර්යංශයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත. ඇය අත්අඩංගුවට ගෙන ඇත්තේ මාලබේ ප්‍රදේශයේදීය.

ඕමානයේ රැකියාවක් ලබා දෙන බව පවසමින් එම සැකකාරිය රුපියල් ලක්ෂ දෙකක මුදලක් ලබා ගෙන වංචාවක් කර ඇති බවට විදේශ සේවා නියුක්ති කාර්යංශයට පැමිණිල්ලක් ලැබී තිබිණි. එම පැමිණිල්ල විභාග කිරීමෙන් අනතුරුව සැකකාරිය අත්අඩංගුවට ගෙන ඇත.

# පාසල්වලට සිසුන් දාන්න හොර සහතික දුන්නැයි ග්‍රාම නිලධාරී කොටු

■ කමල් සුරවීර - මහනුවර

කටුගස්තොට ශාන්ත අන්තෝනි බාලිකාවට සිසුන් ඇතුළත් කිරීම සඳහා දෙමව්පියන් පිරිසකට ව්‍යාජ තොරතුරු ඇතුළත් කර පදිංචි සහතික ලබාදුන් බව කියන සිද්ධියක් සම්බන්ධයෙන් සැකපිට ගඟවට කෝරළය, අංක 251 සෙංකඩගල වසමේ ග්‍රාම නිලධාරිවරයා මහනුවර විශේෂ අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

මහින්ද සෙනරත් පොල්වත්ත නමැති එම ග්‍රාම නිලධාරිවරයා මහනුවර අතිරේක මහෙස්ත්‍රාත් මොහොමඩ් රාෆි හමුවට ඊයේ (06 වැනිදා) ඉදිරිපත් කිරීමෙන් පසු මෙම මස 19 වැනිදා තෙක් රක්ෂිත බන්ධනාගාර ගත කර තිබේ.

සැකකාර ග්‍රාම නිලධාරිවරයා විසින් සෙංකඩගල කඩ කාමර අංක පවා යොදා පාසල්වලට සිසුන් ඇතුළත් කිරීම සඳහා පදිංචි සහතික ලබා දී තිබෙන අතර, එකම අංකයට පදිංචි සහතික දෙකක් පුද්ගලයන් දෙදෙනකුට ලබා දී ඇතැයි ද පැවසේ.

ශාන්ත අන්තෝනි බාලිකා විද්‍යාලේ අතරමැදි පංතිවලට සිසුන් ඇතුළත් කිරීම සඳහා දෙමව්පියන් පිරිසකට කූට ලේඛන සකස් කරදීමේ චෝදනාව මත පොලිසිය විසින් මීට පෙර අත්අඩංගුවට ගත් සරත්චන්ද්‍ර දසනායක නමැත්තා සමග මෙම ග්‍රාම නිලධාරීවරයා දුරකතන සංවාද ගණනාවක් සිදුව තිබෙන බව ද පොලිස් පරීක්ෂණ මගින් අනාවරණය වී තිබේ.

මහනුවර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී චමිල් රත්නායකගේ උපදෙස් මත විශේෂ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩබ්ලිව්.එම්.එස්. උවින්දසිරි ඇතුළු පිරිසක් පරීක්ෂණ පවත්වා සැකකරු අත්අඩංගුවට ගෙන තිබේ.

# පිළියන්දල පොලිසියට පාට් දැමූ ASPගෙන් පැය 7ක් ප්‍රශ්න කරයි

■ බිමල් ජයසිංහ - බණ්ඩාරගම

පිළියන්දල පොලිසියේ සියලු නිලධාරීන්ට බැණවැදීම සම්බන්ධයෙන් චෝදනා එල්ල වූ සහකාර පොලිස් අධිකාරිවරයා පොලිස් මූලස්ථානයේ විශේෂ විමර්ශන ඒකකය වෙත ඊයේ (06 වැනිදා) කැඳවා පැය 7කට අධික කාලයක් ප්‍රකාශ ලබා ගත් බව පොලිස් ආරංචි මාර්ග සඳහන් කරයි.

ඒ අනුව ඊයේ (06 වැනිදා) පෙරවරු 9.30 සිට පස්වරු 04.00 දක්වා සහකාර පොලිස් අධිකාරිවරයාගෙන් ප්‍රකාශ සටහන් කරගෙන තිබේ.

ඇසළ පොහොය දින පිළියන්දල පොලිසිය වෙත පැමිණි එම සහකාර පොලිස් අධිකාරිවරයා තමාට හිතවත් කාන්තාවකගේ පැමිණි ල්ලක් කඩිනමින් විභාග නොකළැයි එම අවස්ථාවේ රාජකාරියේ යෙදී සිටි පොලිස් නිලධාරින්ට ආවේගශීලීව බැණ වැදී එම පොලිසිය පරිශ්‍රයේ පැයකට අධික කාලයක් ගත කර ඇතැයි පැවසේ.

එම සිද්ධිය සම්බන්ධයෙන් වාර්තාවක් පිළියන්දල පොලිසිය විසින් උසස් නිලධාරින් වෙත යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඊට පසු දිනම පිළියන්දල පොලිසිය වෙත පැමිණි පොලිස් මූලස්ථානයේ විශේෂ විමර්ශන ඒකකයේ සහකාර පොලිස් අධිකාරිවරයකුගේ ප්‍රධානත්වයෙන් යුත් කණ්ඩායමක් පිළියන්දල පොලිසියේ ස්ථානාධිපති, විවිධ පැමිණිලි අංශයේ වැඩබලන ස්ථානාධිපති ලෙස එදින කටයුතු කළ උප පොලිස් පරීක්ෂකවරයාගෙන් ඇතුළු පොලිස් නිලධාරින් අට දෙනකුගෙන් පමණ ප්‍රකාශ ලබාගෙන තිබිණි.

පොලිස් මූලස්ථානයේ විශේෂ විමර්ශන ඒකකයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඩී.එස්. වික්‍රමසිංහගේ උපදෙස් මත විමර්ශන සිදු කෙරේ.

# පනතට පටහැනිව විකුණූ චොකලට් හා චුයින්ගම් වැනසීමට නියෝග

■ අනීෂා මානගේ

පාරිභෝගික පනත උල්ලංඝනය කරමින් කොළඹ 12, වේල්ලවීදියේ පිහිටි රසකැවිලි අලෙවිසලක අලෙවියට තබා තිබූ ආනයනික චොකලට් හා චුයින්ගම් තොගයක් රාජසන්තක කර විනාශ කර දැමීමට මාලිගාකන්ද මහෙස්ත්‍රාත් අධිකරණය ඊයේ (6 වැනිදා) නියෝග කළේය.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට ලද තොරතුරක් අනුව ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරි බී.ජ්.සී.පී. පෙරේරා, එච්. ජී.කළුබෝවිල හා එච්.කේ. රවිඳු යන නිලධාරිහු මෙම වැටලීම සිදුකළහ.

මෙම වෙළෙඳසලේ අලෙවියට තබා තිබූ ආනයනික චොකලට්වල රුපියල් හතලිහක් ලෙස මිල සඳහන් කර තිබුණද, ඒවා අලෙවි කර ඇත්තේ රුපියල් දෙසීයකට බව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සඳහන් කරයි. එමෙන්ම උපරිම සිල්ලර මිල, ආනයනකරුගේ නම හා ලියාපදිංචි ලිපිනය ඉංග්‍රීසි බසින් සඳහන් නොකර අලෙවියට තබා තිබූ ආනයනික චුයින්ගම් ග්‍රෑම් 250 පැකට් හාරසීයකට අධික ප්‍රමාණයක් ද නිලධාරින්ගේ භාරයට ගෙන තිබේ.

චුයින්ගම් හා චොකලට්වල වටිනාකම රුපියල් ලක්ෂ හතරහමාරක් පමණ වන බව පැවසේ. නිලධාරින් භාරයට ගත් රසකැවිලි තොගය පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ නිලධාරින් විසින් මාලිගාකන්ද මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර තිබිණි.

# කාලගුණයේ බලපෑමෙන් දවස් දෙකට විදුලිය බිඳ වැටීම් දහහතරදහසක්

■ චාමර පල්ලේගෙදර

පවතින අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් පෙරේද (05 වැනිදා) සහ ඊයේ (06 වැනිදා) පමණක් දිවයින පුරා විදුලිය බිඳ වැටීම් දහහතරදහසකට වැඩි සංඛ්‍යාවක් වාර්තා වූ බව විදුලිබල හා බලශක්ති ඇමැති කංචන විජේසේකර පාර්ලිමේන්තුවේදී ඊයේ (06 වැනිදා) පැවසීය.

වැඩිම බිඳවැටීම් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ නුවරඑළිය හා මහනුවර වැනි ප්‍රදේශවලින් මෙන්ම ජලාශ ආශ්‍රිත ප්‍රදේශවලින් බවද ඇමැතිවරයා සඳහන් කළේය.

ඉන් පාරිභෝගිකයන් පනස්දහසකට වඩා වැඩි පිරිසකට විදුලිය විසන්ධි වී තිබූ බවද ඒ මහතා කීවේය.

එම බිඳ වැටීම් යථා තත්ත්වයට පත් කිරීම සඳහා විදුලිබල මණ්ඩලය ඊයේ (06 වැනිදා) පුරාම කටයුතු කරමින් සිටි බවද හෙතෙම පැවසුවේය.

# ආණ්ඩුව රටටම කුක්කු පොවයි

## මුලින්ම ඉරුවේ ඇමැතිවරු



■ සාලිය කුමාර ගුණසේකර

පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් මෙරට දියර කිරි ප්‍රචලිත කිරීම සඳහා ප්‍රංශ රජයේ ආධාර ඇතිව දිවයින පුරා කුඩා පරිමාණ කිරි නිෂ්පාදනාගාර හයක් ආරම්භ කිරීමට කටයුතු යොද ඇත.

ප්‍රංශ රජයේ සහනදායි පොලී අනුපාත යටතේ ලබා දුන් ණය ආධාර යටතේ ආරම්භ කරන ලද පළමු කුඩා පරිමාණ කිරි නිෂ්පාදනාගාරය කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් වාරියපොළ, මින්හෙට්ටිය, යක්දෙස්සාගල පාමුල පිහිටා තිබෙන ගෝනගම ගම්මානයේදී ඉකුත් 04 වැනිද විවෘත කෙරුණි.

ප්‍රංශ රජයේ යුරෝ මිලියන 13.9 (රුපියල් මිලියන 2,800)ක ආධාර ඇතිව වාරියපොළ, නාවල, පොළොන්නරුව, අත්තනගල්ල, හොරණ සහ වෙන්නප්පුව යන ප්‍රදේශවල කුඩා පරිමාණ කිරි නිෂ්පාදනාගාර පිහිටුවීමට කටයුතු යොද තිබේ.

මෙම කුඩා කිරි කර්මාන්තශාලා ව්‍යාපෘතිය නම්කර ඇත්තේ "කිරෙන් සපිරි දැයක්" යන නමිනි.

වාරියපොළ පිහිටුවා තිබෙන කිරි නිෂ්පාදනාගාරයට කිරි ගොවීහු 4,200 ක් සම්බන්ධවී සිටිති. මෙම කර්මාන්තශාලාවට දිනකට සැපයෙන කිරි ප්‍රමාණය ලීටර් 10,000 කි.

මෙම කර්මාන්තශාලාවලට ගොවීන්ගෙන් කිරි ලීටරයක් රුපියල් 175 ක් වැනි ඉහළ මිලකට මිලදී ගැනෙන අතර, සෑම වසරක් අවසානයේදීම ගොවීන්ට සියයට 10 ක වාර්ෂික ප්‍රතිලාභ (බෝනස්) ලබාදීමට නියමිතය. ඒ අනුව, කර්මාන්තශාලාවලට දිනකට කිරි ලීටර් 50 ක් සැපයෙන ගොවීන්ට වාර්ෂිකව රුපියල් එක්ලක්ෂ පනස් දහසක (150,000) ක ප්‍රතිලාභ ලබා දීමට කටයුතු යොද ඇතැයි කුඩා පරිමාණ කිරි නිෂ්පාදනාගාර ජාලයේ සභාපති එස්.එම්. ලයනල් ධර්මසිරි පැවසුවේය.

කුරුණෑගල, වාරියපොළ ප්‍රදේශයේ ආරම්භ කරන ලද කුඩා පරිමාණ කිරි නිෂ්පාදනාගාරය කෘෂිකර්ම ඇමැති මහින්ද අමරවීර සහ පශු සම්පත් සංවර්ධන රාජ්‍ය ඇමැති ඩී.බී. හේරත්, මෙරට ප්‍රංශ රජයේ තානාපති ජීන් ප්‍රැන්කොයිස් පැක්ටට් විසින් විවෘත කළේය.

වාරියපොළ දියර කිරි කර්මාන්තශාලාව විසින් මේ වනවිට දිනකට නිෂ්පාදනය කරන කල්කිරි ප්‍රමාණය බෝතල් තිස් දහසකි. නවීන තාක්ෂණික උපාංග සහිතව වාරියපොළ කුඩා පරිමාණ කිරි නිෂ්පාදනාගාරය පිහිටුවා තිබේ.

උතුරු නැගෙනහිර පළාත්වලට කුඩා පරිමාණ කිරි නිෂ්පාදනාගාර හතරක අවශ්‍යතාව පවතින බවද, එම කර්මාන්තශාලා පිහිටුවීමට ප්‍රංශ රජයේ සහයෝගය බලාපොරොත්තු වන බව පශු සම්පත් සංවර්ධන රාජ්‍ය ඇමැති ඩී.බී. හේරත් පැවසුවේය.




## සංගීතය වැයෙද්දී

# සාජනුයි පී.සී. යි වෙරිමරගාතේ ගැටයාගෙන් අමුතු මිහිරක් හොයලා

■ එෆ්. අස්ලම්

සංගීත සංදර්ශනයකට පැමිණි මානසික ආතතියෙන් පෙළෙන 20 හැවිරිදි තරුණයෙකුට ලිංගික අතවර කළ බව කියන බීමත් පොලිස් නිලධාරීන් දෙදෙනෙකු ඌවපරණගම පොලිසිය විසින් පෙරේද (05 වැනිද) අත්අඩංගුවට ගෙන තිබේ.

අත්අඩංගුවට ගත් පොලිස් නිලධාරින් දෙදෙනා බණ්ඩාරවෙල කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ප්‍රදීප් කළුපහන විසින් වැඩ තහනමකට ලක්කර ඇති බවත් ඔවුන් දෙදෙනාට එරෙහිව පරීක්ෂණයක්ද ආරම්භ කර ඇති බවත් ප්‍රදේශය භාර උසස් පොලිස් නිලධාරියකු සඳහන් කළේය.

මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ අලුත්වෙල පොලිසියට අනුයුක්තව සේවය කරන 54 හැවිරිදි පොලිස් සැරයන්වරයකු සහ වැලිමඩ පොලිසියට අනුයුක්තව සිට අලුත්වෙල පොලිස් මුරපොළ වෙත අනුයුක්ත කළ පොලිස් කොස්තාපල්වරයකු බව ඌවපරණගම පොලිසිය සඳහන් කරයි.

මෙම තරුණයා පසුගිය මැයි 28 වැනිදත් පසුගිය 02 වැනිදත් මෙම පොලිස් නිලධාරීන් විසින් ලිංගික අතවරයට ලක්කර ඇති අතර ඒ බව කිසිවෙකුට නොකියන ලෙසට මොවුන් තරුණයාට බලපෑම් ද සිදුකර ඇතැයි කියයි.

මෙම තරුණයාගේ ජංගම දුරකතනයේ තිබූ වීඩියෝවක් ඔහුගේ සොහොයුරු දැක ඒ පිළිබඳ කරුණු විමසා ඒ ගැන ඌවපරණගම පොලිසිය වෙත පැමිණිල්ලක් කර ඇත.

ඌවපරණගම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක කපිල ගාල්ලගේ ඇතුළු නිලධාරීන් විසින් සිදුකළ විමර්ශනයට අනුව මෙම පොලිස් නිලධාරීන් දෙදෙනා පෙරේද (05 වැනිද) අත්අඩංගුවට ගෙන ඇත.

ඔවුන්ව ඊයේ වැලිමඩ මහෙස්ත්‍රාත් අධිකරණය හමුවට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

## කාන්තාවගේ පටිය

# අනියම් සැමියාගේ හුස්ම නතර කරයි

■ අසංකා උදේශිනී

රුවන්වැල්ල - දෙරණුව ප්‍රදේශයේ කුලී පදනම මත ලබාගත් නිවසක පදිංචිව සිටි 53 හැවිරිදි කාන්තාවක් විසින් පෙරේද (5 වැනිද) සවස එම නිවස තුළදී සිය අනියම් සැමියා ඝාතනය කර ඇත.

මියගිය පුද්ගලයා කොස්ගම අලුත්අම්බලම ප්‍රදේශයේ පදිංචි තිදරු පියෙකි.

කාන්තාව පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇති අතර එහිදී ඇය පාපොච්චාරණය කර ඇත්තේ පටියකින් ගෙල සිරකර එම ඝාතනය සිදුකළ බවයි.

අත්අඩංගුවට පත් කාන්තාව සිය විවාහක සැමියාගෙන් දික්කසාද වී වෙනම ජීවත් වන අතර මියගිය පුද්ගලයා සමග වසර දෙකක පමණ කාලයක සිට අනියම් සම්බන්ධයක් පවත්වා ඇති බව පොලිසිය පවසයි. සිද්ධිය සම්බන්ධයෙන් රුවන්වැල්ල පොලිසිය වැඩිදුර පරීක්ෂණ ආරම්භ කර ඇත.

DLB සංවර්ධන ලොතරැයි මණ්ඩලය www.dlb.lk

2023.07.05 වන බදාදා නිල ප්‍රතිඵල

| ලොතරැයිය | දිනය | දිනුම් වාරය | වර්ණය | ජයග්‍රාහී අංක | ඉංග්‍රීසි අක්ෂරය / සුපිරි අංකය / මකර | මීළඟ සුපිරි ජයමල්ල රු. |
|---|---|---|---|---|---|---|
| අද කෝටිපති | 2023.07.05 | 1966 | රෝස | 10 24 43 65 | L | 55,142,782/- |
| කප්රුක | 2023.07.05 | 1316 | ලා නිල් | 14 16 41 42 | X, සුපිරි අංකය 30 | 413,352,684.20 |
| ලග්න වාසනාව | 2023.07.05 | 3852 | කොළ | 02 31 42 43 | මකර | 3,061,010/- |
| ජයෝදා | 2023.07.05 | 1936 | කහ | 06 08 24 25 | T | 44,670,475.20 |
| ශනිදා | 2023.07.05 | 4301 | දම් | 06 18 53 57 | W | 50,000,000.00 |
| සුපර් බෝල් | 2023.07.05 | 2140 | රතු | 21 32 61 64 | M | 53,352,668.40 |

ජයග්‍රාහී ටිකට්පත් මාස 06 ක් වලංගු වේ.

# ඩයලොග් එන්ටප්‍රයිස් සවිබල ගැන්වූ ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය 2023

### දේශීය කර්මාන්තකරුවන් සහභාගි වූ ශ්‍රී ලංකාවේ විශාලතම ප්‍රදර්ශනය අති සාර්ථකව නිම වේ

ඩයලොග් එන්ටර්ප්‍රයිසස් මගින් බල ගැන්වෙන 2023 ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය ජූනි 22 වැනි දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී, ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය (ගරු) දිනේෂ් ගුණවර්ධන, කර්මාන්ත සහ වැවිලි කර්මාන්ත අමාත්‍ය (ගරු) වෛද්‍ය රමේෂ් පතිරණ, රාජ්‍ය අමාත්‍යවරුන්, තානාපතිවරුන් සහ මහ කොමසාරිස්වරුන්, කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති වෛද්‍ය සාරංග අලහප්පෙරුම යන මහත්වරුන් සමග ඩයලොග් ආසියටා පී.එල්. සී හි සමූහ ප්‍රධාන විධායක සුපුන් වීරසිංහ, ඩයලොග් එන්ටර්ප්‍රයිසස් සමූහ ප්‍රධාන නිලධාරි නවීන් පීරිස් සහ ඩයලොග් ආසියාටා පී.එල්. සී හි සමූහ ප්‍රධාන මූල්‍ය නිලධාරී හොන්ග් සූ වොන්ග් යන මහත්වරුන්ගේ සහභාගීත්වයෙන් විවෘත කෙරිණි.

ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය (ගරු) දිනේෂ් ගුණවර්ධන මහතා ප්‍රදර්ශනයේ ඩයලොග් එන්ටර්ප්‍රයිස් ප්‍රදර්ශන කුටිය වෙත පැමිණි අතර ඩයලොග් ආසියටා සමූහ ප්‍රධාන විධායක සුපුන් වීරසිංහ මහතා විසින් පිළිගනු ලැබීය. එම අවස්ථාවේ අග්‍රාමාත්‍යවරයා ප්‍රකාශ කළේ "ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය සඳහා ඩයලොග් එන්ටර්ප්‍රයිස් වැනි පෞද්ගලික ආයතන අනුග්‍රහය දැක්වීම රජය ඉතා අගය කොට සලකන අතර මෙහි ප්‍රදර්ශනය කෙරෙන නව්‍ය තාක්ෂණය දේශීය කර්මාන්ත සඳහා පැහැදිලි නව දොරටු විවර වීමක් වනු බව මා විශ්වාස කරනවා" ලෙසයි.

කර්මාන්ත සහ වැවිලි කර්මාන්ත අමාත්‍ය (ගරු) වෛද්‍ය රමේෂ් පතිරණ මහතා ආරාධිතයන් සමග ඩයලොග් එන්ටර්ප්‍රයිස් ප්‍රදර්ශන කුටිය නැරඹීමට පැමිණි අවස්ථාවේ ප්‍රකාශ කළේ "ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය වැනි වේදිකාවක් දේශීය කර්මාන්තකරුවන් සඳහා ලබා දීම පිළිබඳ අමාත්‍යාංශය සතුටට පත් වන අතර එම අවස්ථාවට අනුග්‍රහය දක්වමින් ඩයලොග් එන්ටර්ප්‍රයිස් වෙතින් ලැබෙන සහයෝගය ඉතා අගය කරන බවයි. තවද මෙම ඉදිරිපත් කිරීම් ව්‍යාපාරික ප්‍රජාවට මෙන්ම නරඹන්නන් හට උපකාරී වන බවට තරයේ විශ්වාස කරනවා" ලෙසයි.

ඩයලොග් එන්ටර්ප්‍රයිස් විසින් කාලීන ව්‍යාපාර සංවර්ධන සහය සහ මගපෙන්වීම සමගින් නවතම තාක්ෂණය කර්මාන්තවලට උපයෝගී කරගන්නා ආකාරය ප්‍රදර්ශනය කරනු ලැබූ අතර ජාතික කර්මාන්ත ප්‍රදර්ශනයේ " එන්ටර්ප්‍රයිස් අත්දැකීම" ඉස්මතු කළේය. අති නවීන ආරක්ෂණ විසඳුම්, IoT (Internet of Things), ඩිජිටල් ගෙවීම් සහ ව්‍යාපාර මූල්‍යකරණය මෙන්ම tracking ) fleet management විසඳුම්, තාක්ෂණික ප්‍රදර්ශනයට ඇතුළත් විය. ජාත්‍යන්තර මට්ටමේ ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ මෙරට ව්‍යාපාරික ප්‍රජාවගේ අවශ්‍යතා සාකච්ඡා කිරීමට සහ ඔවුන්ගේ අවශ්‍යතා වඩාත් හොඳින් අවබෝධ කර ගැනීමට ඩයලොග් හි විශේෂඥ කණ්ඩායමක් ප්‍රදර්ශනයට එක් වුණි.

ඩයලොග් එන්ටර්ප්‍රයිස් හි සමූහ ප්‍රධාන නිලධාරී නවීන් පීරිස් මහතා අදහස් දක්වමින් පවසා සිටියේ "ඩයලොග් එන්ටර්ප්‍රයිස් හි අපි සැමවිටම උත්සාහ කරන්නේ සෑම මට්ටමකම ව්‍යාපාර සවිබල ගැන්වීම සඳහා නව්‍ය ඩිජිටල් විසඳුම් සහ අවශ්‍යතාවයන් සපුරා ලීමටයි . අපගේ කර්මාන්ත නැවත ප්‍රබෝධමත් කිරීමේ ජාතික ප්‍රයත්නයට සහයෝගය දැක්වීමට හැකි වීම අප ආඩම්බර වන අතර තවද ඔවුන්ගේ ඉලක්ක කරා ළඟා වීමට රජයේ බලධාරීන්, විවිධ ආයතන, දායක ප්‍රජාව සහ ව්‍යාපාරිකයන් සමග සමීපව කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමු." යනුවෙන්.

ප්‍රදර්ශනය ජූනි 22 සිට 25 දක්වා පැවති අතර කර්මාන්ත අංශ 20 කින් ප්‍රදර්ශන කුටි 700 කින් පමණ සමන්විත විය. දේශීය කර්මාන්ත සහ ව්‍යවසායකත්වයේ අතිසාර්ථක සන්ධිස්ථානයක් වූ 2023 ජාතික ප්‍රදර්ශනයට දිවයිනේ සියලු දෙසින් වාර්තාගත නරඹන්නන් සංඛ්‍යාවක් පැමිණි අතර ප්‍රදර්ශනයේ සමාප්තියෙන් පසු ජූලි මස 9 වැනිදා තෙක් (Virtual exhibition අතථ්‍ය ප්‍රදර්ශනය https://vindustryexpo.idb.lk/ ලෙස දියත් කරනු ලැබේ



ඩයලොග් එන්ටර්ප්‍රයිස් සමූහ ප්‍රධාන නිලධාරි නවීන් පීරිස් මහතා විසින් ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මහතා දැනුවත් කිරීම. පින්තූරයේ වමේ සිට දකුණට කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය (ගරු) ප්‍රසන්න රණවීර, කර්මාන්ත අමාත්‍ය සහ වැවිලි කර්මාන්ත අමාත්‍ය වෛද්‍ය (ගරු) රමේෂ් පතිරණ, ඩයලොග් ආසියටා පීඑල්සී හි සමූහ ප්‍රධාන විධායක නිලධාරි සුපුන් වීරසිංහ සහ සමූහ ප්‍රධාන මූල්‍ය නිලධාරි හොන්ග් සූ වොන්ග් මහතා

INDUSTRY 2023 ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය National Industry Exhibition

Powered by Dialog ENTERPRISE




# කැමරා ඇස

2023 ජූලි 7 සිකුරාදා

ඡායාරූප - ලලිත් පෙරේරා / සමන් අබේසිරිවර්ධන

## අම්මා එක්ක දිය කෙළියේ....



පින්නවල අලි අනාථාගාරයේ සිටින නිවුන් අලිපැටව් දෙදෙනකු කෙණෙර අම්මා සමගින්

## අද අදිනවා.... වාසනාව



කොටුවේ බෝධිය අසල ලොතරැයි වෙළෙන්දෙක්

## මුද්ද සිප ආචාර ....




ශාන්ත පීතර විදුහලේ සිය වැනි සංවත්සර උත්සවයට පැමිණි කාදිනල් හිමියන් පිළිගනිමින්

## සෙල්ලම් ඇති.... යමු සාධු වඳින්න



ඇසළ පෝයට ගංගාරාම පන්සලට පැමිණි කුඩා දරුවන් පිරිසක්



එතෙර අරුණ

# දෑවැද්ද මදි කියා වසර 5කදී ඉන්දීය මනාලියන් 35,000ක් මරලා



■ රුක්ලන්ති පෙරේරා

ඉන්දීය විවාහවලදී දෑවැදි ලබාදීම මෙන්ම ලබාගැනීමද 1961 වසරේ සිට තහනම් කෙරුණද දෑවැදි අර්බුදය වූ කලී තවමත් ඉන්දීය මවුපියන් හා තරුණියන් අන්ත අසරණ කරන සමාජයේ ඔඩු දිවූ දැවැන්ත අර්බුදයක්ව තිබෙන්නකි. බෝපාල් නුවර වෙසෙන විසිහත් හැවිරිදි, වෘත්තියෙන් ගුරුවරියක වන ගන්ජන් තිවාරි (මෙය ඇගේ සැබෑ නම නොවේ)ද දෑවැදි අර්බුදයෙන් උපරිමයට බැට කා සිටින ඉන්දීය තරුණියන් අතරින් එක් අයෙකි. පසුගිය දිනකදී ඇය පොලිසියට පෙත්සමක් ගොනු කළාය. ඒ දෑවැදි ලබාදෙන විවාහ උත්සව වටලා එසේ දෑවැදි ලබාදෙන හා ලබාගන්නා පාර්ශ්ව අත්අඩංගුවට ගන්නා ලෙසට ඉල්ලමිනි. ඇය එබඳු ක්‍රියාමාර්ගයකට යොමු වූයේ දෑවැදි සම්බන්ධයෙන් තමා ලත් අත්දැකීම් පාදක කරගනිමිනි. ඇයට ඉදිරිපත් වූ විවාහ යෝජනා ගණනාවක්ම මනාල පාර්ශ්වයෙන් ප්‍රතික්ෂේප වී තිබුණේ තිවාරිගේ පියා විසින් ලබා දෙන දෑවැද්ද ප්‍රමාණවත් නොවන බවට එල්ල වූ මැසිවිලි මුල් කර ගනිමිනි. ඒ අතරින් මෑතදීම සිදුවූ ප්‍රතික්ෂේප කිරීම සිදුව ඇත්තේ පසුගිය පෙබරවාරියේදීය.

## මනාලිය ලස්සන නම් දෑවැද්දට වට්ටමක්

සිය පියාගේ ඉල්ලීම මත විවාහාපේක්ෂිත තරුණයකු ඇයව බැලීමට පැමිණ තිබුණේ ඔහුගේ මවුපියන් සමගය. දෙපාර්ශ්වය අතර සුහද කතා බහකින් පසු සුපුරුදු පරිදි තිවාරිට මනාල පාර්ශ්වය ඉදිරියට යෑමට සිදුවූයේ තේ බන්දේසියක්ද අතැතිවය. ඇය එබඳු අවස්ථා ගණනාවකටම මුහුණදී තිබුණද ඒ සෑම වාරයක් පාසාම ඇයට දැනුණු චකිතය මෙවරද ඇයට දැනුණේ අඩුවකින් තොරවය. එම අවස්ථාවට ඇය මුහුණ දුන්නේ මනා පුහුණුවකින් හා සූදානමකින් පසුව වුවද තිවාරි සිටියේ තිගැස්මෙනි. ඇගේ මව ඇයට කල් ඇතිවම උපදෙස් දී තිබුණේ කොක් හඬලා සිනා නොවන ලෙසටයි. ඒ ඇගේ සමබර නොවූ දසන් දෙපළට කිසිවකුගේ හෝ අවධානය යොමු නොවනු පිණිසය. පසුගිය වසර කිහිපය පුරාවට තිවාරි මෙබඳු අවස්ථා හයකට මුහුණ දී තිබුණු අතර ඒ සෑම විටෙකම ඇයට යොමු වූ ප්‍රශ්න බෙහෙවින් සමාන විය. කාටත් දැනගැනීමට අවශ්‍ය වූයේ ඇගේ රැකියාව, අධ්‍යාපනය හා ඇයට ඉවුම් පිහුම් කිරීමට හැකිද යන්නය.

පිරිස රැස්ව සිටි කාමරයට ඇතුළු වනවිටදී ඇයට දයාදය ගැන මනාල පාර්ශ්වයෙන් කෙරෙන විමසීම් අසන්නට ලැබිණි. "මට ඇහුණා එයාලා මගේ තාත්තාගෙන් ඉන්දීය රුපියල් මිලියන පහත් හයත් අතර ගාණක් දෑවැද්ද විදිහට ඉල්ලනවා. ඒ විතරක් නෙවෙයි, එයාලා නිකම් විහිළුවට වගේ කිව්වා මම හිතන තරම් ලස්සන නම් දෑවැද්දට වට්ටමක් වුණත් දෙන්න පුළුවන් වේවි කියලා. නමුත් කතාව ගලාගෙන යද්දී මට තේරුණා ඉල්ලපු ගාණ වැඩි මිසක් අඩු වෙන්නේ නැහැ කියලා. මගේ අසමමිතික දත් ගැනයි, මගේ නළලේ තියන ඉන්නා ගැනයි එයාලා ලොකුවට කතා වුණා" තිවාරි කියන්නීය.

## වසර හැටක් පුරා හෙව්වත් මනාලයෙක් හොයා ගන්න බැහැ

නමුත් මනාලයා ගැන ඇයට යම් පැහැදීමක් ඇති වුණේ දයාදය යනු සමාජ හිංසනයක් බවට තිවාරි දැරූ මතයට ඔහු එකඟ වීම නිසාය. කෙසේ නමුදු එවරද ඇගේ විවාහය සිදුවූයේ නැත. මනාල පාර්ශ්වය විසින් සිය දියණියව ප්‍රතික්ෂේප කර ඇති බව දැනගත් විට ඇගේ මව අතිශයින්ම කෝපවූයේ තිවාරි ගැනය. ඒ ඇගේ දෑවැදි විරෝධි ආකල්පය ඊට හේතු වන්නට ඇති බවට මව තුළ වූ විශ්වාසය නිසාය. තිවාරි පවසන ආකාරයට ගතවූ වසර කිහිපය තුළදි ඇගේ පියා ඇගේ විවාහය වෙනුවෙන් පවුල් 100ත් 150ත් අතර සංඛ්‍යාවක් සමග කතාබස් කොට තිබේ. ඉන් පවුල් දෙළහක් පමණ සමග මුණගැසී කතාබහ කොට ඇති අතර ඒ සෑම විටකම තිවාරිව ප්‍රතික්ෂේප වූයේ දයාදය ප්‍රමාණවත් නොවීම නිසාය.

තිවාරි පවසන්නේ බොහෝ පවුල්වලට අවශ්‍ය වන්නේ මිලියන ගණනින් මුදල් වැය කොට දැවැන්ත මංගල සාද සංවිධාන කිරීමට බවය. නමුත් තම පියාට ඒ සා වියදමක් දැරීමට නොහැකි බැව් ඇය දන්නීය. තිවාරිට අවශ්‍ය වන්නේ දයාදයක් නොමැතිව විවාහ වීමටය. නමුත් ඒ නිසාම ඇගේ විවාහය කිසිදු හෝ සිදුවේද යන්නට ඇත්තේ අවිනිශ්චිත බවකි. "මගේ තාත්තා කියන්නේ එයා දැන් අවුරුදු හයක් තිස්සේ මට මනාලයෝ හෙව්වා, නමුත් දෑවැද්දක් නැතිව නම් අවුරුදු හැටක් හෙව්වත් කෙනෙක් හොයාගන්න ලැබෙන්නේ නැහැ කියලයි." තිවාරි කියන්නේ බැරෑරුම්වය.

## දෑවැදි ගන්න මංගල උත්සව වටලන්නැයි පොලිසියට පැමිණිල්ලක්

වසර හැටකට ආසන්න කාලයක සිට ඉන්දියාව තුළ දෑවැදි ලබාදීම හා ලබාගැනීම තහනම් කොට තිබුණ ද දැනටද ඉන්දීය විවාහයන්ගෙන් 90%ක්ම දෑවැදි මුල් කරගනිමින් සිදුවන ඒවාය. මෑතදී සිදුකරන ලද සමීක්ෂණයකට අනුව 1950 - 1999 අතර කාලයේදී එලෙස දයාද ලෙස ලබාදී ඇති මුදලේ වටිනාකම ඇමරිකානු ඩොලර් ට්‍රිලියනයකින් හතරෙන් එකකි. ඉඩකඩම් දේපළ විකුණා, ණය බරින් මිරිකී හෝ දැවැන්ත දයාද ලබාදී සිය දියණියන්ව කුලගෙට යැවුවද ඒ බොහෝ මනාලියන්ට ප්‍රීතිමත් පවුල් ජීවිත හිමිවන්නේ නැත. ජාතික අපරාධ වාර්තා කාර්යාංශයේ දත්තවලට අනුව 2017 - 2022 අතර කාලයේදී ඉන්දීය මනාලියන් තිස්පන්දහස් හාරසිය අනූතුන්දෙනකු ඝාතනයට ලක්වී ඇත්තේ ඔවුන් ප්‍රමාණවත් දයාදයක් රැගෙන නොඒමේ වරදටය.

එසේම ඉන්දීය ජනගහනයේ කාන්තා හා පුරුෂ අසමමිතික අනුපාතයට හේතුව තිබෙන්නේද සමාජයේ මුල්බැසගත් මේ දෑවැදි අර්බුදයයි. ස්ත්‍රී ලිංගික කලල මවුකුස තුළදීම විනාශ කෙරෙන්නේ ගැහැනු දරුවන් දෑවැද්ද නිසාම අනාගතයේදී පවුලට බරක් වීම වැළැක්වීමටය. ගන්ජන් තිවාරි පවසන්නේ දයාදය නමැති පිළිලය සමාජයෙන් ඉවත් කිරීමට නම් විවාහ උත්සව වටලා දෑවැදි ලබාදෙන හා ලබාගන්නා පිරිස් අත්අඩංගුවට ගත යුතු බවය. අවම වශයෙන් දඬුවමට ඇති බිය නිසා හෝ දෑවැදි ලබාගැනීමෙන් වැළකීමට එවැනි පිරිස් පෙලඹෙනු ඇති බව ඇය විශ්වාස කරන්නීය. ඇගේ එම පෙත්සමට සම්පූර්ණ සහයෝගය ලබාදීමට බෝපාල් ප්‍රාන්ත පොලිස් ප්‍රධානි හරිනාරායන් චාරි මිශ්‍රාද එකඟත්වය පළකොට තිබේ.

2023 ජූලි 07 සිකුරාදා 09

අරුණ අපේ පිටුව

පාසලේ තොරතුරු සහ ඔබගේ නිර්මාණවලට
'අපේ පිටුවේ' ඉඩ තිබේ.
අපේ පිටුව, දිනපතා අරුණ, අංක 91, විජේරාම මාවත, කොළඹ 7
aruna.editor@liberty.lk


ආචාර්ය මණ්ඩලය


විදුහල්පතිනිය - එච්.පී. ඉන්ද්‍රිකා

# රන්තොටුවිල මහා විද්‍යාලය


6-11 අංශ ප්‍රධානි


ප්‍රාථමික අංශ ප්‍රධාන


නර්තන අංශය


පරිසර නියමුහට කණ්ඩායම


ප්‍රධාන ශිෂ්‍ය නායක


ප්‍රධාන ශිෂ්‍ය නායිකා


සංගීත අංශය


නියෝජ්‍ය විදුහල්පති පරිපාලන




නියෝජ්‍ය විදුහල්පති සංවර්ධන

දකුණුලක අගනගරය වූ ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටිය කලාපයේ බෙන්තර කොට්ඨාසයේ පිහිටි ගා/ රන්තොටුවිල මහා විද්‍යාලය, 1910 මැයි 02 දින සිසුන් 43 දෙනකුගෙන් සමන්විතව ආරම්භ විය. වර්තමානය වන විට සිසුන් හාරසිය හැත්තෑපහක් පමණ අධ්‍යාපනය ලබන, තිස්පහක් වූ අධ්‍යයන හා අනධ්‍යන කාර්ය මණ්ඩලයකින් යුක්ත මෙම පාසල ගුණ නැණ සවිබල පිරි මානව සම්පත් රටට දයාද කිරීම සිය දැක්ම කොටගෙන බෙන්තොට කොට්ඨාසය තුළ වැජඹෙයි.

රන්තොටුවිල ශ්‍රී ධර්මරක්ෂිතාරාමයෙහි විහාරවාසීව වැඩ විසූ පූජ්‍ය වියන්දුවේ ධම්මදස්සි හිමිපාණන් වහන්සේගේ මූලිකත්වයෙන් ආරම්භ වූ විදුහලෙහි මුල්ම විදුහල්පති වූයේ ජී.ඩී.එච්. මොරගොඩය. එතැන් පටන් ඩී.සී. ගනේගොඩ, ආර්.ඒ.ඩී.ආර්. කරුණාරත්න, චන්ද්‍රසේන කනහැරආරච්චි , ඩී.එස්. රණවක,පී.එල්.බී. සිංඤෝ, ඩී.බී. විතානගේ, කේ.ඩී.සී. කුමාරසිංහ, එච්.පී. පියදස, ඕ.කේ. පියදස, අයි. ජයරත්න, ජේ.ජී. සුනිල් ජයසිංහ යන විදුහල්පතිවරුන් මෙතෙක් ආ ගමන් මගට මහත් ආශිර්වාදයක් විය.

පාසල නව තෝතැන්නක් කරා රැගෙන යාමේ අදිටනින් යුතුව ක්‍රියාකරන එච්.පී. ඉන්ද්‍රිකා වර්තමාන විදුහල්පතිවරියයි. එමෙන්ම ඊට නොදෙවෙනි ශක්තියකින් නියෝජ්‍ය විදුහල්පතිනියන් වන ටී.සී. කාන්ති, එල්. ජී. ලාලනී, 6,7,8 අංශ එම්.ඒ.කේ. සමන්මාලනී / 9,10,11 එච්.සී. මධුෂාන් / ජ්‍යෙෂ්ඨ අංශ ප්‍රධානි යූ.එස්.ආර්. දමයන්ති, ප්‍රාථමික අංශ ප්‍රධානි සී. ගලබඩආරච්චි පාසලේ දියුණුවට උරදරන්නට ඇප කැප වී කටයුතු කරති. ඉතා රමණීය ගැමි පරිසරයක පිහිටියා වූ මෙම විදුහලේ දරු දැරියන්ගේ අධ්‍යාපනය, විනයගරුක බව, මනා ලෙස පවත්වාගෙන යාමට විදුහල්පතිතුමිය සමගින් විදුහලේ ආචාර්ය මණ්ඩලයද දරන්නා වූ මෙහෙය අති ප්‍රශංසනීයයි.



මලල ක්‍රීඩා කණ්ඩායම

සිසු සිසුවියන්ගේ අධ්‍යාපනික මට්ටම කැපී පෙනෙන ප්‍රගතියක් කරා රැගෙන යාමට හැකි වී තිබෙන්නේ මේ සියල්ලන්ගේම ඇප කැප වී කරන්නා වූ නොනිමි මෙහෙවර නිසාවෙනි. ඔවුන්ගේ මෙම අප්‍රතිහත ධෛර්ය හේතු කොට ගෙනම පසුගිය වසර කිහිපය තුළ පාසලේ අධ්‍යාපනික, ක්‍රීඩා, සෞන්දර්ය ආදී වූ සියලුම අංශයන්හි දැවැන්ත ජයග්‍රහණ රැසක් අත්පත් කර ගන්නට හැකි විය.

සෑම වර්ෂයක සේම පසුගිය 2020, 2021 යන වර්ෂයන්හි එක් සිසුවකු හා සිසුවියන් හතර දෙනකු අ.පො.ස උසස් පෙළ කලා විෂය ධාරාවෙන් ඉහළ ප්‍රතිඵල ලබමින් විශ්වවිද්‍යාල වරම් හිමි කර ගන්නා ලදී. එසේම අ.පො.ස සාමාන්‍ය පෙළ අඛණ්ඩව 2021 වර්ෂයේදී ද 95.5% විශිෂ්ට ප්‍රතිඵලයක් පෙන් වූ අතර , ශිෂ්‍යත්ව විභාගයෙන් පසුගිය වසරෙහි සිසුහු හතළිහකින් පස්දෙනෙක් විශිෂ්ට ප්‍රතිඵල පෙන්වමින් සමත් වූහ.

අධ්‍යාපනයෙන් පමණක් නොව මෙහි සිසුන් ක්‍රීඩා කටයුතුවලදී ද ශක්තියෙන්, ජවයෙන් , අනෙකුත් පාසල් අබිබවා ක්‍රීඩාවේ නිරත වන දක්ෂයන්ය. පාසලට නව රන් අරුණැල්ලක් වන් කේ.ඩී. ඉෂාන් දුලංග සහ ඔෂානි අනුරංගි ද සිල්වා ගුරුභවතුන්ගේ මහත් වූ කැපවීම හේතු කොට ගෙන, 2022 වර්ෂයේ කලාප ක්‍රීඩා තරගාවලියේ හතරවැනි ස්ථානයට, ජෝන් ටාබට් තරගයෙන් පළාත් පරිසාදන මට්ටම ඉක්මවා සමස්ත ලංකා තරගයට සහභාගී වීමද පාසල ලද ජයග්‍රහණයකි.

2022 වර්ෂයෙහි CMA ආයතනය මගින් හොඳම වාණිජ සංගමය තේරීමේ තරගාවලියෙන් සමස්ත ලංකා දෙවැනි ස්ථානය හිමි කර ගැනීමට හැකි වීම මෙම පාසල ලද ජයග්‍රහණයන්ගේ ප්‍රබල සංධිස්ථානයකි. වාණිජ විෂය භාර ගයානි සුභාෂිණී එදිරිසිංහ, ආර්ථික විද්‍යා විෂය භාර යූ.එස්.ආර්. දමයන්ති ගුරුමහත්මීන් විසින් මෙය සංවිධානය කරන ලදී.

අධ්‍යාපනයම මූලික කොට ගෙන නොව, විෂය බාහිර සහ සමගාමී ක්‍රියාකාරකම්වලින් කැපී පෙනෙන ජයග්‍රහණ රාශියක් මෙම විදුහල අත්කොට ගෙන තිබේ. විශේෂයෙන්ම නර්තනය හා සංගීත තරගාවලි තුළින් ජයග්‍රහණ රාශියක් අත්පත්කොට ගෙන තිබේ. නර්තන අංශයන් 2019 වර්ෂයේ ඒකල පහතරට සරල කවිතාල තරගයෙන් සමස්ත ලංකා කුසලතා දිනා ගන්නේ විදුහලට කීර්තියක් ලබා දෙමිනි.

සිසුන් තුළ පරිසර ආකල්ප සංවර්ධනය කිරීමේ අරමුණින් යුක්ත පාසල් නියමු හට කණ්ඩායම විදුහලේ විවිධ වූ පාරිසරික ක්‍රියාකාරකම් සිදුකරයි.


සංගීත අංශය

එසේම පාසලේ පෙරදිග තූර්ය වාදක කණ්ඩායම සියලුම සුවිශේෂ අවස්ථාවන් වර්ණවත් කරයි.

ගණිත, විද්‍යා, සිංහල භාෂා, සමාජ විද්‍යා, වාණිජ, කෘෂිකර්ම, ගෘහවිද්‍යා ආදී විෂය තරග තුළින් නිරන්තරයෙන්ම විශිෂ්ට ජයග්‍රහණ රැසක් අත්පත් කර ගනිමින් රන්තොටුවිල මහා විදුහල අනෙකුත් විදුහල් අතරින් දිදුලයි. ඒ සඳහා මහත් වූ කැපවීමක් ඉටුකරනු ලබන අධ්‍යයන කාර්ය මණ්ඩලය සේම, අනධ්‍යන කාර්ය මණ්ඩලයේ නොමද දායකත්වයද සුවිශේෂය. එසේම දරු දැරියන්ගේ දස්කම් පෑමට නිබඳවම අත්වැල සපයන්නා වූ දෙමාපිය දායකත්වය විදුහල දිනෙන් දින බබළවන්නට මනා හේතුවකි.

**සම්බන්ධීකරණය :- සිරිසේන මද්දෙවිතාන**


කතාව සහ ඡායාරූප :-

ඒ.ඒ. චම්පිකා - ඇල්පිටිය


වානිජ අංශය








මෙවර ශිෂ්‍යත්වය ලෙහෙසියෙන් ජය ගන්න

රුපියල් 850ක මිලකට

5 වසර කිරණ

ගුරු මණ්ඩලයෙන් මෙවර විභාගය ඉලක්ක කර සැකසූ

විශේෂ අනුමාන ප්‍රශ්න පත්‍ර 20ක මල්ලක්...

දිවයින පුරා පුවත්පත් නියෝජිතයන්ගෙන් සහ පොත්හල්වලින් දැන් මිලදී ගත හැක

විශේෂ ඇණවුම් සඳහා විමසන්න 0762568348